වාර්ෂික වාර්තාව
2017

පටුන

I වන කොටස

අප ගැන 5

1. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පිළිබඳ තතු 9
   - 1.1 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය 9
   - 1.2 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ උපාය මාර්ගික ප්‍රවේශය 10
   - 1.3 පාලක සභාව 11
   - 1.4 ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සහ ආචාර්ය මණ්ඩලය 13
   - 1.5 කාර්ය සහ සංවිධාන ව්‍යුහය සහ සේවක සංඛ්‍යා තත්වය 16
     - 1.5.1 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කාර්ය ව්‍යුහය 16
     - 1.5.2 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සංවිධාන ව්‍යුහය 17
     - 1.5.3 සේවක සංඛ්‍යා තොරතුරු 18

II වන කොටස

2017 වසර තුළ සම්පූර්ණ කරන ලද කාර්යභාරය 19

2. ඉගෙනුම් සහ සංවර්ධන වැඩසටහන් 14
   - 2.1 සේවාරම්භක පුහුණු වැඩසටහන් 20
   - 2.2 දීප ව්‍යාප්ත සේවාවන් සඳහා වන අනිවාර්යය ඉගෙනුම් සහ සංවර්ධන වැඩසටහන් 22
   - 2.3 ඩිප්ලෝමා පාඨමාලාවන් 26
   - 2.4 කෙටි කාලීන ඉගෙනුම් හා සංවර්ධන වැඩසටහන් 27
   - 2.5 රිසිකරණය කරන ලද ඉගෙනුම් හා සංවර්ධන වැඩසටහන් 29
   - 2.6 ප්‍රසිද්ධ සම්මන්ත්‍රණ 30
   - 2.7 විදේශ පුහුණු ආයතනය සමග ඒකාබද්ධව පවත්වන ලද ඉගෙනුම් සහ සංවර්ධන වැඩසටහන් 35
   - 2.8 විදේශීය පුහුණු ආයතනයන්හි නිලධාරීන් සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණ . 36
   - 2.9 පොදු පරිපාලනය 41
3. පශ්චාත් උපාධි අධ්‍යයන පාසල 39
4. කළමනාකරණ උපදේශන 40
5. 2017 වසර තුළ පවත්වන ලද විභාග 41
6. පොදු පරිපාලනය 41
   - 6.1 මානව සම්පත් කළමනාකරණය 41
   - 6.2. පහසුකම් සම්පාදන කළමනාකරණය 42
   - 6.3 අභ්‍යන්තර ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම 42
   - 6.4 තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම 42
   - 6.5 විගණන විමසුම 43
7. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති 43
   - 7.1 ගැටුම්වලින් බලපෑමට ලක් වූ ප්‍රදේශයන්හි ප්‍රජා සංවර්ධනයට සම්බන්ධ ඉදිරිපෙළ නිලධාරීන් සඳහා JICA මගින් අරමුදල් සැපයෙන සංවර්ධන ව්‍යාපෘති (FORWARD Project)..... 43
   - 7.2 එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන් සහාය 44

8. විශේෂ අවස්ථා 45
8.1 වසර 35න උදාර සේවය සැමරීම 45
8.2 හරිත ව්‍යාපෘතිය සඳහා ජාතික හරිත බලශක්ති ශූරතාව දිනා ගැනීම 46
8.3 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යයන පීඨ ගොඩනැගිල්ල විවෘත කිරීම 47
8.4 තිරසර ලංකා ප්‍රදර්ශනය 47
8.5 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත දකුණු ආසියාවේ කළමනාකරණ පුහුණු ආයතනවල ප්‍රධානීන්ගේ පැමිණීම 47
8.6 චීනයේ Huazhong තාක්ෂණ විශ්වවිද්‍යාලයේ නියෝජිතයින් පිරිසකගේ පැමිණීම 48
8.7 චීනයේ ජිනෑන් විශ්වවිද්‍යාලයේ නියෝජිතයින් පිරිසකගේ පැමිණීම 49
8.8. ගංවතුර සහනාධාර වැඩසටහන 49
8.9 රුක් රෝපණ වැඩසටහන 49
8.10 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා බැහැරගත පුහුණු වැඩසටහන... 50
8.11 ශාරීරික සුවතා දිනය 50
8.12 වෙසක් උත්සව සැමරුම් වැඩසටහන 51

III වන කොටස

3. නව මූලාරම්භයන් 52
3.1 2017-2021 සඳහා උපාය මාර්ගික සැලැස්ම පිළියෙල කිරීම 52
3.2 නව ඩිප්ලෝමා වැඩසටහන්/ පුහුණු වැඩසටහන් හඳුන්වා දීම 52
3.3 පර්යේෂණ ආරම්භයන් 55
3.4 රාජ්‍ය නිළධාරීන් සඳහා වැඩසටහන් ආරම්භ කිරීම 56
3.5 ISO තත්ත්ව සහතික ලබාගැනීම සඳහා මූලාරම්භය 56
3.6 ඩිජිටල් රාජ්‍ය මානව සම්පත් ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කිරීම 56

IV වන කොටස

4. වත්මන් අභියෝග සහ අනාගත සැලසුම් 57
4.1 වත්මන් අභියෝග 57
4.2 අනාගත සැලසුම් 57

V වන කොටස

5. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය 61
5.1 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය 61
5.2 මූල්‍යමය විශ්ලේෂණය 62

VI වන කොටස

6. විගණකාධිපති වාර්තාව සහ පිළිතුරු 63

6.1 විගණන කමිටුවේ වාර්තාව 63

6.2 රැස්වීම් 63

6.3 මෙහෙවර සහ කාර්ය භාරය 64

6.4 සමුද්දේශ විෂය 64

6.5 මූල්‍ය වාර්තාකරණය 64

6.6 අභ්‍යන්තර පාලන 65

6.7 අභ්‍යන්තර විගණනය 65

I කොටස

පාලක සභා සභාපති තුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 2017 වර්ෂය සඳහා වන වාර්ෂික කාර්යය සාධන වාර්තාවේ නිරීක්ෂණ සම්බන්ධයෙන් මෙම පණිවිඩය නිකුත් කිරීමට හැකිවීම පිළිබඳව මම මහත් සේ සතුටු වෙමි. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය රාජ්‍ය නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය, අරමුණු කේන්ද්‍රීය පර්යේෂණ අධ්‍යයනයන් සහ සංවිධිත සංවර්ධන සේවා තුළින් රාජ්‍ය හා රජය සතු ව්‍යවසායන්හි වැඩිදියුණුව හා කාර්යක්ෂමතාව නංවාලීමට අදාල පුහුණු මධ්‍යස්ථානයක් බව අප සියළු දෙනා දන්නා කරුණකි.

2017 වර්ෂයේදී නිම කරන ලද කාර්යයන් නිරීක්ෂණයට භාජනය කිරීමේදී දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් 774 දෙනෙකු සේවා ආරම්භක පුහුණු පාඨමාලා 09 ක් හරහා පුහුණු කරනු ලැබ ඇති අතර එම වැඩසටහන් වලට විශිෂ්ට රාජ්‍ය නිලධාරීන්ගේ දේශනයන් ද ඇතුළත්ව ඇත. තවද කාලීන තේමාවන්ට අදාල විශේෂ සම්මන්ත්‍රණ හා විදේශ පුහුණු ආයතනයන්ගේ සහයෝගය ඇතිව ඉගෙනුම් හා සංවර්ධන වැඩසටහන්ද පවත්වා ඇත. මෙම සියළු ඉගෙනුම් හා පුහුණු තුලින් අපගේ රාජ්‍ය සේවාව සංවිධාන කේන්ද්‍රගත බවට වඩා ජනතා කේන්ද්‍රගත බවට පරිවර්තනය වීම වඩාත් කඩිනම් කරනු ඇත.

එසේම ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් විදේශ පුහුණු ආයතන සඳහා ද සම්මන්ත්‍රණ හා වැඩමුළු පවත්වා ඇති අතර ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය සඳහා විදේශ අධ්‍යයන චාරිකා ද සංවිධානය කරනු ලැබ ඇත.

වසරකට රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන්හි සේවයේ යෙදී සිටින නිලධාරීන් 75 පමණ රාජ්‍ය කළමනාකරණ විද්‍යාපති (MPM) උපාධිධාරීන් ලෙස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පශ්චාත් උපාධි පාසල විසින් අප රටට දායාද කර ඇත.

රාජ්‍ය නිලධාරීන්ගේ ක්‍රියාශීලී අධ්‍යයන කාර්යයන් මධ්‍යයේ වුවද ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය තිරසර හරිත පරිසර සංරක්ෂණයෙහි වැදගත්කම අමතක කර නොමැත. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පාලක සභාවේ සභාපති ලෙස එම ආයතනය විසින් දිනාගන්නා ලද 2017 වර්ෂයේ හරිත බලශක්ති කුසලතා සම්මානයට එක් වීමට ලැබීම මහත් භාග්‍යයක් ලෙස මම සලකමි.

ජේ. ජේ. රත්නසිරි
පාලක සභාවේ සභාපති
ලේකම් - රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

අධ්‍යක්ෂ ජනරාල් තුමිය ගේ පණිවුඩය

2017 වසර තුළ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි කාර්යසාධනය සම්බන්ධයෙන් මෙවැනි සමාලෝචනයක් ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව මම බෙහෙවින් සතුටු වෙමි. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ "විද්‍යා දදාති විනයං" යන තේමාව සහ ආසියාවෙහි රාජ්‍ය අංශයේ ඉගෙනුම් සහ සංවර්ධනය පිළිබඳ සුවිශිෂ්ටතම මධ්‍යස්ථානය බවට පත්වීම යන දැක්ම සමගින් බැඳෙමින් අදාල වසර තුළ කැපීපෙනෙනා සහ ඉහල මට්ටමක කාර්යසාධනයක් අත්කරගැනීමට අපට හැකියාව ලැබිණි.

2017 වසර තුළදි ආයතනය විසින් සේවාරම්භක පුහුණු වැඩසටහන් 09 ක් දීප ව්‍යාප්ත සේවා උදෙසා පවත්වන ලද අතර ඊට නිලධාරීහු 774 දෙනෙක් සහභාගී වූහ. එහිදී ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් විසින් විශේෂ ආරාධිත දේශනයන් පවත්වන ලදී.

ජ්‍යෙෂ්ඨ රාජ්‍ය සේවකයන් උදෙසා ධාරිතා සංවර්ධන වැඩසටහනෙහි කොටසක් ලෙසින් මලයාසියාවෙහි සංචාරයක් ඇතුළත් කරන ලද අතර ඊට නිලධාරීහු 275 දෙනෙක් සහභාගී වූහ. ඒ අතර වසර තුළ පවත්වන ලද ඩිප්ලෝමා වැඩසටහන් සංඛ්‍යාව 8කි. එහිදී ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාවට සහභාගී වූ 321 දෙනා ද ඇතුළුව සහභාගීත්වය 540ක් විණි. තවද කෙටි කාලීන පුහුණු වැඩසටහන් 35ක් පවත්වන ලද අතර එහිදී පුහුණුව ලද නිලධාරීන්ගේ සංඛ්‍යාව 767කි. එසේම පුහුණු වැඩ සටහන් 07 තුළදී සහභාගිවන්නන් 117ක් උදෙසා තොරතුරු තාක්ෂණයට අදාලව මධ්‍යම මට්ටමේ වෘත්තීය ධාරිතා සංවර්ධන වැඩ සටහන් පවත්වනු ලැබිණි.

සමාලෝචිත වර්ෂය තුළදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වන ලද සාමාන්‍ය පුහුණු වැඩසටහන් වලට අමතරව විදෙස් පුහුණු ආයතනවල නිලධාරීන් සහ විදෙස් ජාතිකයන් උදෙසා වැඩමුළු සහ සම්මන්ත්‍රණ කිහිපයක් සඳහා සම්බන්ධීකරණ කටයුතු කරන ලදී.

2017 වසර ආරම්භයේදී පශ්චාත් උපාධි අධ්‍යයන පාසැල මගින් පශ්චාත් උපාධි අධ්‍යයන සිසුන් 224 කගේ සහභාගීත්වයෙන් රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි කණ්ඩායම් තුනක් මෙහෙයවන ලදී. තවද පශ්චාත් උපාධි අධ්‍යයන පාසැල මගින් වෙනත් රටක අධ්‍යයන චාරිකාවක් වශයෙන් චීනයේ හස්ට් (HUST) සරසවිය කරා අධ්‍යනය සංචාරයක් ද සංවිධානය කරන ලදී. "පර්යේෂණයන් භාවිතාවන් බවට පරිවර්තනය කිරීම - සාක්ෂිමත පදනම්වූ ප්‍රතිපත්ති සම්පාදන වැඩසටහන" යන තේමාව යටතේ 2017 වසර තුළ පශ්චාත් උපාධි අධ්‍යයන පාසැල මගින් වාර්ෂික පර්යේෂණ සම්මේලනය සංවිධානය කරන ලදී.

2017 වසර තුළදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් කාර්ය මණ්ඩල, පරිපාටි, පිළිබඳ සමාලෝචන, අත්පොත් සහ මාර්ගෝපදේශයන් සැකසීම සඳහා උපදේශන සේවා සපයනු ලැබිණි. ආයතනයේ විභාග අංශය විසින් බාහිර ආයතන සඳහා විභාග 98ක් ද අභ්‍යන්තර වැඩසටහන් වෙනුවෙන් විභාග 33 ක් ද පවත්වනු ලැබිණි.

මේ වන විට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය තිස් පස් වසරක මහඟු සේවාවක් ජාතියට සපයමින් හෙට දිනයේදී වඩා හොඳ ශ්‍රී ලංකාවක් ගොඩ නැගීම සඳහා නිපුණතා සපිරි, කාර්යක්ෂම මෙන්ම සේවය සඳහා කැපවූ රාජ්‍ය සේවාවක් බිහි කිරීම පිණිස රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරීන් සවිබල ගන්වනු ලැබ ඇත.

වසන්තා පෙරේරා
අධ්‍යක්ෂ ජනරාල්

1. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පිළිබඳ තතු

අප ගැන

1.1 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශය යටතේ සංස්ථාපිත ආයතනයන් වන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය 1982 වසරේදී 1982 අංක 9 දරණ පණතෙහි විධිවිධාන අනුව පිහිටුවා ඇත. එය රාජ්‍ය අංශයෙහි විධායක නිලධාරීන්ගේ නිපුණතා වර්ධනය සහ වෘත්තීමය සංවර්ධනය පිළිබඳ වගකීම පැවරෙන ජාතික මට්ටමේ ප්‍රමුඛ ආයතනය වේ.

පොදු යහපත උදෙසා වන ස්වකීය හරයාත්මක වටිනාකම් තුළ රාජ්‍ය අංශයෙහි නිලධාරීන් සඳහා පුහුණුව සැපයීම, රාජ්‍ය අංශයේ ආයතනයන්ට ඇවැසි කළමනාකරණ උපදේශන සේවා සැපයීම සහ රාජ්‍ය අංශයේ නිලධාරීන් පර්යේෂණ සඳහා දිරි ගැන්වීම ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි ප්‍රධාන කාර්යභාරයන් වේ.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පශ්චාත් උපාධි පිරිනැමීමේ හැකියාව ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිරිනමනු ලැබ ඇත. ආයතනයෙහි පශ්චාත් උපාධි අධ්‍යයන පාසැල විසින් රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව පිරිනමනු ලබයි.

මෙම පාඨමාලාව අමාත්‍යාංශ ලේකම්වරුන්, ප්‍රධාන විධායක නිලධාරීන් සහ අනෙක් පාර්ශවකරුවන්ගේ දායකත්වයට ඉල්ලුමක් පවතින, වර්තමානයේ වේගයෙන් වෙනස් වන සහ අභියෝගාත්මක වන රාජ්‍ය කළමනාකරණ පරිසරයේ අවශ්‍යතාවන් සපුරාලීමේ අරමුණින් හඳුන්වා දී ඇත.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පාලක සභාව රාජ්‍ය පරිපාලන විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ණ මෙහෙයවීම යටතේ ආයතනයෙහි ප්‍රතිපත්ති තීරණය කිරීම සම්බන්ධයෙන් වගකීමට බැඳී සිටියි.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පුහුණු සහ පර්යේෂණ ක්ෂේත්‍රයන්හී සහයෝගීතාව උදෙසා පහසුකම් සපයන ලන්ඩන් සිවිල් සේවා විද්‍යාලය, සිංගප්පූරු සිවිල් සේවා විද්‍යාලය, චීනයේ බීජිං විදේශ අධ්‍යයන සරසවිය, පරිපාලනය පිළිබඳ ඉන්දියාවේ ලාල් බහදූර් ශාස්ත්‍රී ජාතික ඇකඩමිය, ඕස්ට්‍රේලියාවේ මොනෑෂ් සරසවිය, මාල දිවයිනේ සිවිල් සේවා පුහුණු ආයතනය, චීනයේ හුවාසොන්ග් විද්‍යා සහ තාක්ෂණ සරසවිය, වැනි විදෙස් සරසවි සහ පුහුණු ආයතන කිහිපයක් සමග ජාලගතව සිටියි. ද්වී පාර්ශ්වික පුහුණු සහ පර්යේෂණ සහයෝගීතාව වර්ධනය කිරීමේ අරමුණින් 2017 වසරේදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය දකුණු කොරියාවෙහි රාජ්‍ය ප්‍රතිපත්ති සහ කළමනාකරණය පිළිබඳ විද්‍යායතනය (KDI) සමග අවබෝධතා ගිවිසුමකට එළඹිණි.

ගෙවී ගිය වසර තිස් පහක කාලය තුළ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන දැනුම් වර්ධනය, කුසලතා වර්ධනය, ආයතන සංවර්ධනය සහ පර්යේෂණ ඇතුළුව විස්තීර්ණ සේවා සම්පාදනයෙහි නියැලෙමින් සවිමත් ආයතනයක් බවට පත්ව සිටියි.

1.2 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ උපාය මාර්ගික ප්‍රවේශය.

දැක්ම

රාජ්‍ය අංශයේ ඉගෙනුම් හා සංවර්ධන ක්‍රියාවලියෙහි ආසියාවේ විශිෂ්ටතම මධ්‍යස්ථානය බවට පත්වීම.

මෙහෙවර

ඉගෙනුම හා සංවර්ධනය, උපදේශන සේවා සහ පර්යේෂණ මගින් නිර්මාණශීලි අනාගත දැක්මක් හා පුරවැසි කේන්ද්‍රගත රාජ්‍ය සේවාවක් සඳහා අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සඳහා පහසුකම් සැලසීම

උපාය මාර්ගික ඉලක්ක

- වඩාත් ක්‍රියාශීලි හා ඵලදායී රාජ්‍ය සේවාවක් නිර්මාණය කිරීමේ ජාතික සංවර්ධන පරමාර්ථයට දායක වීම.
- ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සංවර්ධනයට දායකත්වය සැපයීමේ ප්‍රධාන හවුල් කරුවකුවීම.
- සංවර්ධන පරිපාලන ආයතන පිළිබඳව එහි පාර්ශවකරුවන් අතර ධනාත්මක ප්‍රතිරූපයක් ගොඩනැංවීමත් එතුළින් එහි ඉගෙනුම් හා සංවර්ධන වැඩසටහන් සඳහා ඉල්ලුම ඉහළ නැංවීම.
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය දකුණු හා ගිණිකොණ දිග ආසියාවේ රාජ්‍ය පරිපාලනය හා කළමනාකරණ සංවර්ධන කළමනාකරණය පිළිබඳ සහයෝගිතා මධ්‍යස්ථානයක් බවට පත් කිරීම.

ප්‍රධාන කාර්යයන්

- රාජ්‍ය අංශයේ කළමනාකාර නිලධාරීන්ගේ ධාරිතාවය ගොඩනැංවීම සඳහා ඉගෙනුම් ක්‍රියාවලිය හා වැඩසටහන් සැකසීම.
- පශ්චාත් උපාධි වැඩසටහන් මගින් රාජ්‍ය අංශයේ නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීම.
- රාජ්‍ය ප්‍රතිපත්ති හා කළමනාකරණය පිළිබඳ අරමුණු සහගත පර්යේෂණ තැන්පතුවක් පවත්වාගෙන යාම.
- රාජ්‍ය අංශයේ ආයතන හා රජය සතු ව්‍යවසායන්හි ඵලදායීතාව හා කාර්යක්ෂමතාව නංවාලීම සඳහා සංවිධාන සංවර්ධන සේවාවන් පැවැත්වීම.
- රාජ්‍ය සේවය සඳහා කාර්යක්ෂමතා කඩඉම් හා භාෂා පරීක්ෂණ පැවැත්වීම.

අපගේ සාරධර්ම

- විශිෂ්ටත්වය, කැපවීම, අසමානතාව, වගවීම, තිරසාරභාවය

උපායමාර්ගික අභිලාෂය

- "වඩා හොඳ අනාගත ශ්‍රී ලංකාවක් සඳහා රාජ්‍ය අංශය බලගැන්වීම."

1.3 පාලක සභාව

රාජ්‍ය පරිපාලන අමාත්‍යවරයා විසින් 1982 අංක 09 දරණ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන පණතේ 6(1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් නිලධාරීන් 2017 වසරෙහි පාලක සභාවෙහි සාමාජිකයන් ලෙස පත් කරන ලදී.



ජේ.ජේ. රත්නසිරි මහතා
සභාපති,
ලේකම්,
රාජ්‍ය පරිපාලන
සහ කළමනාකරණ
අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.



සමන් ඒකනායක මහතා
සාමාජික,
අග්‍රාමාත්‍ය ලේකම්,
අග්‍රාමාත්‍ය කාර්යාලය,
අංක. 58, අර්නස්ට් ද
සිල්වා මාවත,
කොළඹ 07.



නීල් ද අල්විස් මහතා
සාමාජික,
ලේකම්,
ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.



ඩී.සී. දිසානායක මහතා
සාමාජික,
ලේකම් උසස් අධ්‍යාපන
සහ මහා මාර්ග
අමාත්‍යාංශය,
අංක 216,
මග නැගුම මහ මැදුර,
ඩෙන්සිල් කොබ්බෑකඩුව
මාවත, කොස්වත්ත,
බත්තරමුල්ල.



**එච්.ටී. කමල් පත්මසිරි
මහතා**
සාමාජික,
ලේකම්, පළාත් සභා
සහ පළාත් පාලන
අමාත්‍යාංශය,
අංක. 330, කොල්වින්
ආර් ද සිල්වා මාවත,
(යුනියන් පෙදෙස)
කොළඹ 02.



**පී.බී.එස්.සී. නෝනිස්
මහතා**
සාමාජික,
කොම්ප්ට්‍රෝලර්
ජනරාල්, මුදල් සහ
ජනමාධ්‍ය අමාත්‍යාංශය,
මහලේකම් කාර්යාලය,
කොළඹ 01.



චාරන් අමරතුංග මහතා
සාමාජික,
කළමනාකරණ
උපදේශක,
අංක. 10B, ගවර් වීදිය,
කොළඹ 05.



**ඩී.ඒ. විජිත් මහේන්ද්‍ර
රත්නසේකර මහතා**
සාමාජික,
කන්දෙවත්ත ටෙරස්,
1/31ඒ,
පිටත පූර්වාරාම පාර,
නුගේගොඩ.



කේ.ඩී.ඩී.කේ. ද ආබෘ මහතා
සාමාජික,
අංක 699/6,
ජොනෙක් වත්ත පාර,
දළුගම, කැළණිය.



ඒස්. සුරේෂ් සී. ප්‍රනාන්දු මහතා
සාමාජික,
අංක. 3 බී,
හළුදාගොඩ පාර,
පිටත ටෙම්ප්ලර්ස් පාර,
ගල්කිස්ස.



වසන්තා පෙරේරා මහත්මිය
සාමාජික,
අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා සංවර්ධන
පරිපාලන ආයතනය,
අංක 28/10,
මලලසේකර මාවත,
කොළඹ 07.

1.4 ජ්‍යෙෂ්ඨ කළමනාකරණය සහ ආචාර්ය මණ්ඩලය

වසන්තා පෙරේරා මහත්මිය

අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා පරිපාලන සේවය - විශේෂ ශ්‍රේණිය.

ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය, තාක්ෂණ විශ්වවිද්‍යාලය, සිඩ්නි, ඕස්ට්‍රේලියාව.

ආර්ථික සංවර්ධනය සඳහා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.

කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය, පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.

විද්‍යාවේදී උපාධිය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.

කේ.එම්.ඩී. ජයසේකර මහත්මිය

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඉගෙනුම් හා සංවර්ධන) ශ්‍රී ලංකා පරිපාලන සේවය - විශේෂ ශ්‍රේණිය.

රාජ්‍ය පරිපාලන පිළිබඳ පශ්චාත් උපාධිය, පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.

උපාය මාර්ගික මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය, වික්ටෝරියා විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියාව.

කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා, කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය, ශ්‍රී ලංකාව.

ජීව විද්‍යාව පිළිබඳ උපාධිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.

අධ්‍යන කාර්ය මණ්ඩලය

ඩබ්ලිව්.එම්.ඩී. විජේකෝන් මහතා

ජ්‍යෙෂ්ඨ උපදේශක

නාගරික පරිසර කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධිය, AIT - තායිලන්තය.

භූගෝල විද්‍යා ගෞරවවේදී උපාධිය, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.

ඒ. ලොකුගමගේ මහතා

ජ්‍යෙෂ්ඨ උපදේශක, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (I ශ්‍රේණිය).

මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව.

ආර්ථික සංවර්ධන පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව.

ආයතනික සහ උපායමාර්ගික මූල්‍ය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව.

HNDA. DPFM. DIPPCA. Dip. in IT. MAAT

ආචාර්ය එස්.ආර්.එස්.එන්. සුදසිංහ මෙනවිය

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, (PGDS) රාජකාරී ආවරණය.

ජ්‍යෙෂ්ඨ උපදේශක, අධ්‍යයන සම්බන්ධීකාරක - පශ්චාත් උපාධි අධ්‍යයන පාසල

සංවර්ධන පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධිය, (රාජ්‍ය ප්‍රතිපත්ති කළමනාකරණය පිළිබඳ විශේෂඥ)
සංවර්ධන පරිපාලනය පිළිබඳ ජාතික ආයතනය, බැංකොක්, තායිලන්තය.

ආර්ථික විද්‍යා පශ්චාත් උපාධිය, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.

ආර්ථික සංවර්ධන පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.

ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.

එන්.ජේ. ජයසුන්දර මහත්මිය

ජ්‍යෙෂ්ඨ උපදේශක -

පාරිසරික ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය, කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

කෘෂිකර්මය පිළිබඳ ගෞරවවේදී උපාධිය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

පරිසර කළමනාකරණය පිළිබඳ වෘත්තීය සහතිකය (CDG ජර්මනිය)

ඒ.බී අෂ්රොෆ් මහතා

ජ්‍යෙෂ්ඨ උපදේශක

ශ්‍රී ලංකා පරිපාලන සේවය (I ශ්‍රේණිය)

මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

නීතිඥ ආර්. දිසානායක මහත්මිය

ජ්‍යෙෂ්ඨ උපදේශක

ශ්‍රී ලංකා පරිපාලන සේවය (I ශ්‍රේණිය)

දිවුරුම් කොමසාරිස්

ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

ජාත්‍යන්තර සබඳතා පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (BCIS)

නීතිවේදී උපාධිය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

විද්‍යාවේදී ගෞරව උපාධිය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

රාජ්‍ය ප්‍රසම්පාදනය සහ ගිවිසුම් කරණය පිළිබඳ ඩිප්ලෝමා, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

ජේ.එස් .පී. පියසේන මහතා

ජ්‍යෙෂ්ඨ උපදේශක

ශ්‍රී ලංකා පරිපාලන සේවය (I ශ්‍රේණිය)

සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

ව්‍යවහාරික විද්‍යා පිළිබඳ උපාධිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

ටී. අබේවර්ධන මෙනවිය

ජ්‍යෙෂ්ඨ උපදේශක

ශ්‍රී ලංකා පරිපාලන සේවය (I ශ්‍රේණිය)

ජාත්‍යන්තර සබඳතා පිළිබඳ පශ්චාත් උපාධිය, ICU, ටෝකියෝ, ජපානය

ව්‍යාපාරික පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

පාරිසරික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

ඊ - රාජ්‍යකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

සත්ව විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

රාජ්‍ය පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

කේ.ආර්. ගංගාධාර මහතා

ජ්‍යෙෂ්ඨ උපදේශක
ශ්‍රී ලංකා පරිපාලන සේවය (I ශ්‍රේණිය)
ජාත්‍යන්තර හා සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය, ANU, ඕස්ට්‍රේලියාව
ජාත්‍යන්තර සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධි ඩිප්ලෝමා (ANU, ඕස්ට්‍රේලියාව)
භූවිද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
රාජ්‍ය පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

එන්.අයි. ලියනගේ මහතා

ජ්‍යෙෂ්ඨ උපදේශක
ශ්‍රී ලංකා පරිපාලන සේවය (I ශ්‍රේණිය)
MPPM (මෙල්බර්න්), ඕස්ට්‍රේලියාව
සංවර්ධන සැලසුම්කරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, රුහුණු විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ගෞරවවේදී උපාධිය

එන්.එම්.එස්.ඒ. බණ්ඩාර මහතා

උපදේශක
තොරතුරු තාක්ෂණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
විද්‍යාවේදී උපාධිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
වන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

එම්.ආර්. වක්කුඹුර මහත්මිය

උපදේශක
සාමය හා ගැටුම් අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධිය, ඔස්ලෝ විශ්වවිද්‍යාලය, නෝර්වේ
ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
මානව හිමිකම් පිළිබඳ ඩිප්ලෝමාව, ශ්‍රී ලංකා මානව හිමිකම් ආයතනය
සාමයික පර්යේෂණ පශ්චාත් උපාධි වැඩසටහන, PRIO සහ ඔස්ලෝ විශ්වවිද්‍යාලය, නෝර්වේ.

එම්. පෙරේරා මහතා

සහය උපදේශක
පශ්චාත් විද්‍යාවේදී උපාධිය (කෘතිම බුද්ධිය), මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
තොරතුරු තාක්ෂණවේදී උපාධිය, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

කේ. ප්‍රසන්න චන්දිත් මහතා

අධ්‍යක්ෂ (පාලන)
ශ්‍රී ලංකා පරිපාලන සේවය (I ශ්‍රේණිය)
ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය රජරට විශ්වවිද්‍යාලය
විද්‍යාවෙදී උපාධිය පේරාදෙණිය විශ්වවිද්‍යාලය
තිරසාර සංවර්ධනය සඳහා අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා (උප්සලා විශ්වවිද්‍යාලය, ස්වීඩනය)
රාජ්‍ය කළමණාකරනය පිළිබඳ ඩිප්ලෝමා (ස්වීඩනය)

ආර්. ඒ. එස්.පී. රණවීර

ලේඛකාධිකාරී
විද්‍යාවේදී (ගෞරව) පේරාදෙණිය විශ්වවිද්‍යාලය
කර්මාන්ත ගණිතය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

ටී. එස්. කරස්නාගොඩ මහත්මිය

සහකාර අධ්‍යක්ෂ (විභාග)
ශ්‍රී ලංකා පරිපාලන සේවය
සේවා කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය කොළඹ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව
විද්‍යාවේදී උපාධිය කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
රාජ්‍ය පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

ටී.ඩී. නාරංගොඩ මහත්මිය

අභ්‍යන්තර විගණක
ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, කැලණිය විශ්වවිද්‍යාලය
ICAS හි ව්‍යාපාර සහ මූල්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
BBMtg. මානව සම්පත් (විශේෂවේදී).

බී.ඒ.පී. බාලසූරිය මහත්මිය

පුස්තකාලයාධිපතිනිය
වරලත් පුස්තකාලයාධිපති
පුස්තකාල සහ විඥාපන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
ශාස්ත්‍රවේදී උපාධිය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
කළමනාකරණ ඩිප්ලෝමා, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
පුස්තකාල විද්‍යා ඩිප්ලෝමාව (ශ්‍රී ලංකා පුස්තකාල සංගමය)
පුස්තකාල ස්වයංකරණ පාඨමාලාව (ශ්‍රී ලංකා පුස්තකාල සංගමය)

එස්.එල්.අයි. සමරවික්‍රම මහත්මිය


සහකාර ලේඛකාධිකාරී
ශාස්ත්‍රපති උපාධිය (ආර්ථික විද්‍යාව), කැලණිය විශ්වවිද්‍යාලය
විද්‍යාවේදී උපාධිය මානව සම්පත් කළමනාකරණය (විශේෂ), SJP විශ්වවිද්‍යාලය.

එස්. ඒ. මනම්පේරි මහතා


ද්වී භාෂා ලිපිගොනු කරණය සංස්කරණ සහ පරිවර්තන නිළධාරි, ශ්‍රී ලංකා පරිපාලන සේවය
ශාස්ත්‍රපති උපාධිය (මානව සම්පත් සංවර්ධනය) මැංචෙස්ටර් විශ්වවිද්‍යාලය එක්සත් රාජධානිය
පශ්චාත් උපාධි ඩිප්ලෝමා රාජ්‍ය කළමනාකරණය,
(මානව සම්පත් කළමනාකරණ විශේෂිත), කනෙක්ටිකට් විශ්වවිද්‍යාලය එක්සත් ජනපදය
ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා, ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය

1.5 කාර්ය සහ සංවිධාන ව්‍යුහය සහ සේවක සංඛ්‍යා තත්වය

1.5.1 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කාර්ය ව්‍යුහය



1.5.2 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සංවිධාන ව්‍යුහය



1.5.3 සේවක සංඛ්‍යා තොරතුරු

2017 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව සහ තනතුරු සංඛ්‍යාව පහත පරිදි වේ.

වගු අංක 1

2017 වසරේ සේවක සංඛ්‍යා තොරතුරු

කාර්ය මණ්ඩල වර්ගීකරණය	අනුමත සේවක සංඛ්‍යාව	2017.12.31 දිනට පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ කළමණාකරන ශ්‍රේණිය	32	15
මධ්‍යම මට්ටමේ කළමනාකරණ ශ්‍රේණිය	14	08
කණිෂ්ඨ කළමනාකරණ ශ්‍රේණිය	24	13
කළමනාකරණ සහකාර	54	09
ප්‍රාථමික - ශිල්පීය	14	05
ප්‍රාථමික - ශිල්පීය නොවන	27	04
එකතුව	165	54

II කොටස

2017 වසර තුළ සම්පූර්ණ කරන ලද කාර්යභාරය

2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුල සම්පූර්ණ කරන ලද කාර්යභාරය පහත දැක්වේ.

2. ඉගෙනුම් සහ සංවර්ධන වැඩ සටහන්

ඉගෙනුම් සහ සංවර්ධන අංශය යනු ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි ඉගෙනුම් සහ සංවර්ධන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් කටයුතු කරන ප්‍රධාන අංශය වේ. එමගින් රාජ්‍ය අංශයේ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන අවශ්‍යතා සපුරාලනු වස් ඉගෙනුම් සහ සංවර්ධන වැඩසටහන් සම්පාදනය කරනු ලබයි. මෙකී අරමුණ සාධනය උදෙසා අංශය සතුව රාජ්‍ය අංශයේ වෙනස්වන නිපුණතා ප්‍රවර්ධන අවශ්‍යතා සමග පෙරට යා හැකි ව්‍යුහයක් සකස් කරනු ලැබ ඇත.

රාජ්‍ය අංශයේ ආයතනයන්හි සහ එහි කළමණාකාරීත්ව සේවක සංඛ්‍යාවේ නිපුණතා සංවර්ධනය උදෙසා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පහත සඳහන් ක්‍රියාකාරකම් පවත්වාගෙන යයි.

2.1 සේවාරම්භක පුහුණු පාඨමාලා

පහත සඳහන් දීප ව්‍යාප්ත සේවාවන්ට අළුතින් බඳවාගනු ලබන නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව පැවැත්වීම. (ගාස්තු අය නොකරන වැඩසටහන්)

- ශ්‍රී ලංකා පරිපාලන සේවය (ශ්‍රී.ලං.ප.සේ),
- ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (ශ්‍රී.ලං.ග.සේ),
- ශ්‍රී ලංකා සැලසුම් සේවය (ශ්‍රී.ලං.සැ.සේ),
- ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය (ශ්‍රී.ලං.වි.සේ)
- ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවය (ශ්‍රී.ලං.වා.වි.සේ)
- ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය (ශ්‍රී.ලං.ඉ.සේ)
- ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සේවය (ශ්‍රී.ලං.තො.ස.තා.සේ)

2.2 ධාරිතා සංවර්ධන වැඩසටහන් - සිය පළමු සහ තෙවන පංති මට්ටම්වල පසුවන දීප ව්‍යාප්ත සේවාවන්හී නිලධාරීන් උදෙසා අනිවාර්ය ධාරිතා සංවර්ධන වැඩසටහන් (ගාස්තු අය නොකරන වැඩසටහන්)

2.3 ඩිප්ලෝමා වැඩසටහන් (ගාස්තු අය කරන වැඩසටහන්)

2.4 කෙටි කාලීන පුහුණු වැඩ සටහන් (ගාස්තු අය නොකරන වැඩසටහන්)

2.5 අවශ්‍යතා අනුව පවත්වනු ලබන පුහුණු වැඩ සටහන් - රාජ්‍ය අංශයේ ආයතන සහ රාජ්‍ය ව්‍යවසායකත්වයන් විසින් කරනු ලබන ඉල්ලීම් මත පදනම්වන (ගාස්තු අය කරන වැඩසටහන්)

2.6 සම්මන්ත්‍රණ (ගාස්තු අය කරන සහ නොකරන වැඩසටහන්)

SLIDA

2.1 සේවාරම්භක පුහුණු වැඩ සටහන්

දීප ව්‍යාප්ත සේවාවන්ට අළුතින් බඳවා ගනු ලබන නිලධාරීන් උදෙසා ඔවුන් හට සිය සේවාන් තුළ පෙරටුගාමීන් ලෙස ස්වකීය කාර්යභාරය ඉටු කිරීමට හැකිවන සේ විෂය කරුණු පිලිබඳ පුළුල් පරාසයක් ආවරණය වන අයුරින් සහ ඔවුන් අවශ්‍ය දැනුමින් නිපුණතාවන් සහ ආකල්පයන්ගෙන් සන්නද්ධ කරනු වස් සේවාරම්භක පුහුණුව පවත්වනු ලැබේ. ප්‍රධාන විෂය කරුණු ආවරණය වනසේ සකසන ලද මොඩියුලයන්ට අමතරව කොතලාවල ආරක්ෂක පීඨයේ සහභාගීත්වයෙන් බාහිර පුහුණු වැඩසටහන් ලෙස පුද්ගල සහ පෞරුෂත්ව සංවර්ධනය පිණිස විශේෂ වැඩ සටහන් මීට ඇතුලත් කර තිබේ. තවද ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ භාෂා මධ්‍යස්ථානය මගින් සේවාරම්භක පුහුණු තුළ ඉංග්‍රීසි භාෂා පුහුණුවක්ද පවත්වා ඇත. ඇතැම් වැඩසටහන් බ්‍රිතාන්‍ය කවුන්සිලයේ සහයෝගයෙන් පවත්වන ලදී.

සමාලෝචිත වර්ෂය තුළදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය දීප ව්‍යාප්ත සේවාවන්හී නිලධාරීන් 774 දෙනෙකු උදෙසා සේවාරම්භක පුහුණු වැඩසටහන් 9ක් පවත්වා ඇති අතර එහි විස්තර පහත දැක්වේ.

වගු අංක 11

2017 වසර තුළදී පවත්වන ලද සේවාරම්භක පුහුණු වැඩසටහන්

	දීප ව්‍යාප්ත සේවා	සහභාගී වූ සංඛ්‍යාව
1	ශ්‍රී ලංකා පරිපාලන සේවය (විවෘත) - 2017 කණ්ඩායම	101
2	ශ්‍රී ලංකා පරිපාලන සේවය (සීමිත) - 2017 කණ්ඩායම	28
3	ශ්‍රී ලංකා පරිපාලන සේවය (විවෘත) - 2015 කණ්ඩායම	209
4	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය - 2015 කණ්ඩායම	179
5	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය - 2016 කණ්ඩායම	84
6	ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සේවය (I පංතියේ නිලධාරීන් - III ශ්‍රේණිය)	31
7	ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සේවය (II පංතියේ නිලධාරීන් - II ශ්‍රේණිය) කණ්ඩායම	42
8	ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සේවය (II පංතියේ නිලධාරීන් - II ශ්‍රේණිය) කණ්ඩායම II	50
9	ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සේවය (III පංතියේ නිලධාරීන්-II ශ්‍රේණිය)	50
	එකතුව	774

ඉහත සඳහන් සේවාරම්භක පුහුණුවලට පහත සඳහන් ප්‍රධාන නිලධාරීන් විසින් පවත්වනු ලබන විශේෂ ආරාධිත දේශන ද ඇතුලත් වේ.

- ඔස්ටින් ප්‍රනාන්දු මහතා, ජනාධිපති ලේකම් (හිටපු ආණ්ඩුකාර නැගෙනහිර පළාත) - රාජ්‍ය නිලධාරීන්ගේ කාර්යභාරය සහ පරිපාලනයේ විවිධ ස්ථර
- සමන් ඒකනායක මහතා, අග්‍රාමාත්‍ය ලේකම් - සවිබලගැන්වුන ශ්‍රී ලංකාවක් සහ 2017 ඔබ්බට නායකත්වය
- සුමිත් අබේසිංහ මහතා - අමාත්‍ය මණ්ඩල ලේකම් - ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ පරිපාලන කාර්යභාරය

- ආචාර්ය ආර්.එච්.එස්. සමරතුංග, මුදල් අමාත්‍යාංශ ලේකම් - ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික පරිවර්තනය
- ජේ.ජේ.රත්නසිරි මහතා, රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් - ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන්ගේ වගකීම්
- පී.බී. අබේකෝන් මහතා, හිටපු ජනාධිපති ලේකම් - "සේවා නායකයකු වීම"
- නීල් ද අල්විස් මහතා, ලේකම් ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - රාජ්‍ය සේවකයන්ගේ ආචාර ධර්ම
- ධාරා විජේතිලක මහත්මිය හිටපු ලේකම් සහ ලංකා වාණිජ මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරීනි - රාජ්‍ය සේවා අව්‍යාජත්වය සහ හැසිරීම ඉහල මට්ටමකින් සහ විශ්වසනීය අයුරින් පවත්වා ගැනීම





2017 වසරේදී ශ්‍රී ලංකා පරිපාලන සේවයට අලුතින් බඳවා ගන්නා ලද කණ්ඩායම් දෙකක 230 දෙනකුගෙන් සමන්විත පිරිස (2015 කණ්ඩායම සහ 2017 සීමිත කණ්ඩායම) ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සේවාරම්භක පුහුණුව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව රාජ්‍ය පරිපාලන ඩිප්ලෝමා සුදුසුකම සහිතව සේවයට ප්‍රවිශ්ඨ විය. ඊට අමතරව විවෘත ධාරාවෙන් බඳවා ගන්නා ලද 101 දෙනකුගෙන් සමන්විත නව කණ්ඩායමද ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ස්වකීය පුහුණු මොඩියුලයන් සම්පූර්ණ කළ පසුව ක්ෂේත්‍ර පුහුණුව පිණිස මැතිවරණ දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරන ලදී.

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට අලුතින් බඳවා ගන්නා ලද නිලධාරීන් 263 දෙනෙක් සහ ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සේවයට අලුතින් බඳවා ගන්නා ලද නිලධාරීන් 173 දෙනෙක් 2017 වසර තුළදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි ස්වකීය සේවාරම්භක පුහුණුව සම්පූර්ණ කළහ.

වගු අංක 111

දීප ව්‍යාප්ත සේවාවන් සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන්

	දීප ව්‍යාප්ත සේවා	සහභාගී වූ සංඛ්‍යාව	
1	ශ්‍රී ලංකා පරිපාලන සේවය (සීමිත) - 2017 කණ්ඩායම	27	
2	ශ්‍රී ලංකා පරිපාලන සේවය (විවෘත) - 2015 කණ්ඩායම	203	
3	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය - 2015 කණ්ඩායම	169	
4	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය - 2016 කණ්ඩායම	80	
5	ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සේවය (I පංතියේ නිලධාරීන් - III ශ්‍රේණිය)	31	
6	ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සේවය (II පංතියේ නිලධාරීන් - II ශ්‍රේණිය) 1 ශ්‍රේණිය	42	
7	ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සේවය (II පංතියේ නිලධාරීන් - II ශ්‍රේණිය) 2 ශ්‍රේණිය	50	
8	ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සේවය (III පංතියේ නිලධාරීන් - III ශ්‍රේණිය)	50	
	එකතුව	**652**	

2.2 දීප ව්‍යාප්ත සේවාවන් සඳහා වන අනිවාර්යය ඉගෙනුම් සහ සංවර්ධන වැඩ සටහන්

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය දීප ව්‍යාප්ත සේවාවන්හී නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනයට අවශ්‍ය වන්නාවූ දැනුම, කුසලතා සහ ආකල්ප අඛණ්ඩව පෝෂණය සහ සංවර්ධනය කිරීම ස්වකීය ප්‍රමුඛ වගකීම් අතරින් එකක් සේ හඳුනාගෙන සිටියි.

එහෙයින් කාර්යක්ෂම සහ සඵලදායී රාජ්‍ය සේවයක් සහතික කරනු පිණිස මේ නිලධාරීන් අතර අඛණ්ඩ ඉගෙනුම් සංස්කෘතියක් පෝෂණය කිරීම ඉහල වැදගත්කමක් උසුලයි. ඒ අනුව දීප ව්‍යාප්ත සේවාවන්හී නිලධාරීන් උදෙසාම පවත්වනු ලබන මේ වැඩසටහන් පහත සඳහන් සංකල්ප මත පදනම් වේ.

- කාලයෙන් කාලයට අවශ්‍ය වන්නාවූ විශේෂයෙන් හඳුනාගන්නා ලද චර්යාමය සහ තාක්ෂණික නිපුණතාවන් වර්ධනය කිරීම
- වේගයෙන් වෙනස්වන සමාජ පරිසරයක නිතිපතා වර්ධනය වන අභියෝගයන්ට මුහුණ දීම උදෙසා අවශ්‍ය වන්නාවූ දැනුම සහ කුසලතා අඛණ්ඩව යාවත්කාලීන සහ උත්ශ්‍රේණිගත කිරීම.

එහෙයින් 2017 වසර තුළ ආයතනය විසින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සහ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් 567 දෙනකු උදෙසා සේවාවන් අතරමැදදී වෘත්තීය ධාරිතා සංවර්ධන වැඩ සටහන් පවත්වන ලදී. එම වැඩසටහන් වලට අදාල තොරතුරු පහත පරිදි වේ.

වගු අංක **iv**

2017 වසරේදී පවත්වන ලද ධාරිතා සංවර්ධන වැඩසටහන්

සේවය	වැඩසටහන්	සහභාගී වූ සංඛ්‍යාව
ශ්‍රී ලංකා පරිපාලන සේවය (I පංතිය)	6	177
ශ්‍රී ලංකා පරිපාලන සේවය (III-I පංතිය)	8	273
ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (I පංතිය)	3	84
ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (III-I පංතිය)	1	33
එකතුව	**18**	**567**

පළවන පංතියේ නිලධාරීන් උදෙසා විදෙස් අත්දැකීම් ලබාගැනීමේ අධ්‍යයනයක් ලබාදීම සඳහා මලයාසියාවෙහි සංචාරයක්ද ධාරිතා සංවර්ධන වැඩසටහනට ඇතුලත් කරන ලදී. මේ වැඩසටහනෙහි අරමුණ වූයේ ස්වකීය අධ්‍යයනයන් තුළ ප්‍රායෝගික අත්දැකීම් ලබාගැනීමට සහ ඉගෙනීම පිණිස මැලේසියානු අත්දැකීමකට ඉඩ සැලසීමයි. පුහුණු විෂය මාලාව සහ ක්‍රමවේදය මූලික වශයෙන්ම තොරතුරු හුවමාරුව සහ ජාත්‍යන්තරව භාවිතා වන හොඳම පරිචයන් ඉගෙනීම ඉලක්ක කරගනිමින් ඉලක්කගත කණ්ඩායම බලගැන්වීම පිණිස වන උපායමාර්ගයන් මත පදනම් විණි.

ඒ අනුව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි මධ්‍ය මට්ටමේ වෘත්තීය ධාරිතා වර්ධන වැඩසටහන සම්පූර්ණ කර සිටි ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් 126ක්, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් 14ක් සහ ශ්‍රී ලංකා සැලසුම් සේවයෙහි නිලධාරීන් 13ක් හට 2017 වසරේදී මැලේසියාවෙහි විදෙස් අධ්‍යනය තුළින් අත්දැකීම් ලබාගැනීමට ඉඩ සලසන ලදී.





DEVELOPMENT ADMINISTRATION MODERNIZATION AND TRANSFORMATION PROGRAMME (THE MALAYSIAN EXPERIENCE)

11 - 17 June 2017, Kuala Lumpur, Malaysia






Development Administration Modernization and Transformation Programme
(The Malaysian Experience)
21-27 October 2017, Berjaya Times Square Hotel
Kuala Lumpur, Malaysia.
SEATED: A.D. HIRANTHI KAWSHALYE RANASINGHE, JANAKI DAMAYANTHI AMARATHUNGA, THILANKA RUWINDANIE WETTHASINGHE HORAWALA WITHANAGE, HETTIARACHCHIGE MARIAN SUJEEWA PUSHPA KUMARI THISSERA, S.L.D.K. WIJAYASINGHE, CHAMPIKA THUSHARI ROSHANIE DISSANAYAKE, DR. SHAHRIZIN, HANIZA (UNIMARA), ANUSHA NILANTHI BATAWALA GAMAGE, N.M.J. FERNANDO, W.M.S.N. CHANDANI, NIRMALA SUBHASHINEI ATHUKORALA, DANEESHA CHUSHNI JAYADEWA.
STANDING: EDDY, W.G.W. WANASINGHE, M.G. LALITH ANANDA, RAJALINGAM RUSHANDAN, B.J.R.A.W.C. RANASINGHE, R.K.R.R. RANAWEERA, T.R. WARUNA SRI DHANAPALA, D.D. UPUL SHANTHA DE ALWIS, A.M.R.S.A.B. ADIKARI, S.M.D.C. SAMARASEKARA, NORISZIAN.
TOP ROW: N.K.R. PATHIRANA, K.U. CHANDRALAL, G.G.S.C. ROSHAN, E.A. RATHNASEELA, RANIL WICKRAMASEKARA, H.A.V.P. HAPANGAMA, S.K.W. SISIRA KUMARA, L.W.M. GAMAGE, NALAKA KALUWEWE.

2.3 ඩිප්ලෝමා පාඨමාලාවන්

2017 වසර තුළදී පහත සඳහන් ඩිප්ලෝමා වැඩසටහන් පවත්වන ලදී.

වගු අංකය v

2017 වසර තුලදී පවත්වන ලද ඩිප්ලොමා පාඨමාලාවන්

අනු අංකය	වැඩසටහනේ නම	වැඩ සටහනේ කාලය	වැඩ සටහන් සංඛ්‍යාව	සහභාගි වූ සංඛ්‍යාව
01	තොතුරු තාක්ෂණ ඩිප්ලෝමාව	මාස 6	1	16
02	රාජ්‍ය ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් පරිපාලන ඩිප්ලෝමාව	වසර 1	1	40
03	රාජ්‍ය ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් පරිපාලන ඩිප්ලෝමාව	වසර 1	1	57
04	රාජ්‍ය ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව	මාස 14	1	40
05	ගබඩා කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව	වසර 1	1	36
06	සැපයුම් සහ ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව	වසර 1	1	30
07	ඉංග්‍රීසි ඩිප්ලෝමාව	වසර 1	3	184+67+70
08	රැකියා අවශ්‍යතා උදෙසා වන ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව	මාස 9 (මට්ටම් 3)		165+89+200

2017 වසර තුළදී නිලධාරීහු 43 දෙනෙක් ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් පරිපාලන ඩිප්ලෝමාව සම්පූර්ණ කළහ. නිලධාරීහු 23 දෙනෙක් ඉන්දියාවෙහි විදෙස් පුහුණු අත්දැකීම් ලබා ගත්හ.



2.3.1 භාෂා මධ්‍යස්ථානය

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ භාෂා මධ්‍යස්ථානය පහත වැඩසටහන් දෙක හේතුවෙන් රාජ්‍ය අංශයේ නිලධාරීන් අතර ප්‍රචලිත වී ඇත.

- ඉංග්‍රීසි ඩිප්ලෝමාව
- රැකියා අවශ්‍යතාවන් සඳහා වන ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව (CEEP)

මෙම මධ්‍යස්ථානය මගින් පවත්වන ඉංග්‍රීසි ඩිප්ලෝමා වැඩසටහන රාජ්‍ය අංශයේ නිලධාරීන් අතර ඉතා ප්‍රචලිතය. 2017 දී මෙම ඩිප්ලෝමාව සඳහා නිලධාරීන් 184ක් අවස්ථා තුනක දී බඳවා ගන්නා ලද අතර නිලධාරීන් 67 දෙනෙක් 2016 සිට මෙම වැඩසටහනට සහභාගී වෙමින් සිටියහ . මින් පෙර වසරවල ඇතුලත් වූ කණ්ඩායම්වල නිලධාරීන් 70 දෙනෙක් 2017 දී ඩිප්ලෝමාව සම්පූර්ණ කළහ.

2017 දී රැකියා අවශ්‍යතාවන් සඳහා වන ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව සඳහා නිලධාරීන් 165ක් ඇතුළත් කර ගන්නා ලද අතර ඒ අතරින් නිලධාරීන් 89 දෙනෙකු 2016 සිට පාඨමාලාව හදාරමින් සිටි නිලධාරීන් වේ. පසුගිය වසරවල ඇතුලත් වූ කණ්ඩායම්වල නිලධාරීන් 200 දෙනෙක් 2017 දී ඩිප්ලෝමාව නිම කළහ. ඉහත වැඩසටහන් දෙක මගින් භාෂා මධ්‍යස්ථානය රු. 9,073,600 00 ක සම්පූර්ණ ආදායමක් උපයා ගන්නා ලදී.

මෙම මධ්‍යස්ථානය මගින් දීප ව්‍යාප්ත සේවාවන්ගේ නිලධාරීන් අතර ඉංග්‍රීසි/ සිංහල කථික තරඟයක් ආරම්භ කරන ලදී. තවද එමගින් අභ්‍යන්තර කාර්ය මණ්ඩලය සඳහා දුරකථන ආචාර විධි හා සන්නිවේදන කුසලතා පිළිබඳ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. මෙම මධ්‍යස්ථානය මගින් 2017 වසර තුළ රාජ්‍ය අංශයේ නිලධාරීන් සඳහා ප්‍රසිද්ධ දේශන පැවැත්වීම, Negotiation Skills" Public Diplomacy and Protocols පිළිබඳ පුහුණු වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී.

2.3.2 තොරතුරු තාක්ෂණ අංශය

පුහුණු හා උපදේශන සේවාවන් හරහා රාජ්‍ය අංශයේ ආයතනයන්හි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සංවර්ධනය සඳහා සහාය වීම අරමුණු කරගනිමින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ තොරතුරු තාක්ෂණ අංශය ස්ථාපිත කරන ලදී. තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව අත්‍යාවශ්‍ය තොරතුර තාක්ෂණ කුසලතා වර්ධනය කිරීම සඳහා මෙම අංශය මගින් පවත්වන විශේෂ වැඩසටහන් අතරින් එකකි. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පරිගණක ධාවන බලපත්‍ර වැඩසටහනක් ද පවත්වන අතර එම වැඩසටහන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සහ ප්‍රාදේශීය දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානවල රාජ්‍ය අංශ නිලධාරීන් අතර ප්‍රචලිතව පවතියි.

සේවාරම්භක පුහුණු වැඩසටහන්, මධ්‍යම මට්ටමේ රැකියා ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් හා පශ්චාත් උපාධි අධ්‍යයනවලට අමතරව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ තොරතුරු තාක්ෂණ අංශය මගින් පහත දැක්වෙන පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

වගු අංක **vii**

වසර තුල පවත්වන ලද තොරතුරු තාක්ෂණික වැඩසටහන්

අනු අංකය	වැඩසටහනේ නම	වැඩසටහනේ කාල සීමාව (දින)	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගිවන්නන් සංඛ්‍යාව
01	ශ්‍රී.ලං.සං..පරි. ආයතනයෙහි පරිගණක ධාවන බලපත්‍රය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (Certificate in SLIDA Computer Driving License)	10	3	66
02	තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව (Diploma in Information Technology)	28	1	14
03	කාර්යාල පරිපාලනය සඳහා පරිගණක යෙදුම් (Computer Application for Office Administration)	7	1	10
04	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා පාඨමාලා කළමනාකරණ පද්ධතිය පිළිබඳ විශේෂ පරිගණක පුහුණුව (Special Computer Training on Course Management System for SLIDA Staff)	2	1	16
05	ඊ-රාජ්‍ය හා ආරක්ෂාව (E- Government & Security)	2	1	11

2.4 කෙටිකාලීන ඉගෙනුම් හා සංවර්ධන වැඩසටහන්

සමාලෝචිත කාල සීමාව තුළ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පහත දැක්වෙන කෙටිකාලීන පුහුණු වැඩසටහන් 34 පවත්වන ලද අතර එමගින් නිලධාරීන් 782 දෙනෙකු පුහුණු කරන ලදී.

වගු අංක **vii**

වසර තුලදී පවත්වන ලද කෙටි කාලීන පුහුණු පාඨමාලා

අනු අංකය	වැඩසටහනේ නම	වැඩසටහනේ කාල සීමාව (දින)	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගිවන්නන් සංඛ්‍යාව
01	රාජ්‍ය ප්‍රසම්පාදනයේ හරය (Essence of Public Procurement)	3	4	70
02	ලංසු ඇගයීම පිළිබඳ වැඩමුළුව (Workshop on Bid Evaluation)	3	5	104
03	මූල්‍ය නොවන කළමනාකරුවන් සඳහා රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ වැඩමුළුව (Workshop on Public Financial Management for Non-Financial Managers)	3	1	19
04	රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ වැඩමුළුව (Workshop on Public Finance Management)	1	2	54
05	පර්යේෂණ යෝජනා සකස් කිරීම පිළිබඳ වැඩමුළුව (Workshop on Research Proposal Writing)	1	2	23
06	ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් සඳහා මහජනයා ඇමතීම පිළිබඳ කුසලතා (Public Speaking Skills for Senior Managers)	2	2	38
07	විනය ක්‍රියාපරිපාටිය පිළිබඳ වැඩමුළුව (Workshop on Disciplinary Procedure)	3	2	105

08	විනය ක්‍රියාපරිපාටිය පිළිබඳ වැඩමුළුව (Workshop on Disciplinary Procedure)	5	1	26
09	විනය ක්‍රියාපරිපාටිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (Certificate Course Disciplinary Procedure)	10	1	25
10	පරිපාලකයින් සඳහා නීතිය (I වන කොටස) (Law for Administrators (Part I))	5	1	19
11	පරිපාලකයින් සඳහා නීතිය (II වන කොටස) Law for Administrators (Part II)	5	1	14
12	ආපදා අවදානම් කළමනාකරණය (Disaster Risk Management)	5	1	18
13	ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ වැඩමුළුව (Workshop on Solid Waste Management)	3	1	22
14	තීරණ ගනු ලබන්නන් සඳහා මෘදු කුසලතා පිළිබඳ වැඩමුළුව (Workshop on Soft Skills for Decision Makers)	3	2	30
15	ප්‍රතිපත්ති පත්‍රිකා සකස් කිරීම පිළිබඳ වැඩමුළුව (Workshop on Writing Policy Papers)	4	1	11
16	පුහුණුකරුවන් පුහුණු කිරීම පිළිබඳ වැඩමුළුව (Workshop on Training of Trainers)	5	1	22
17	SLIDA හි පරිගණක ධාවන බලපත්‍රය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (Certificate in SLIDA Computer Driving License)	10	3	66
18	ඊ-රාජ්‍ය හා ආරක්ෂාව (E-Government and Security)	2	1	12
19	පරිපාලන නිලධාරීන් සඳහා පරිගණක යෙදුම් (Computer Application for Administrative Officers)	7	1	9
20	අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම පිළිබඳ වැඩමුළුව (Workshop on Preparing Cabinet Paper Memoranda)	පැය 3	1	95
	එකතුව		**34**	**782**

2.5 රිසිකරණය කරන ලද ඉගෙනුම් හා සංවර්ධන වැඩසටහන්

රාජ්‍ය ආයතනවල ඉල්ලීම පරිදි 2017 වසර තුළ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පුහුණු වැඩසටහන් 42ක් පවත්වන ලද අතර නිලධාරීන් 1129ක් පුහුණු කරන ලදී. මෙම වැඩසටහන් සේවාදායක සංවිධාන මගින් සිදු කරන ලද ඉල්ලීම්වලට ගැලපෙන ලෙස විශේෂයෙන් සැලසුම් කරන ලදී. සමාලෝචිත කාල සීමාව තුළ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පවත්වන ලද පුහුණු වැඩසටහන් මගින් දීප ව්‍යාප්ත සේවාවන්හි සේවක සංඛ්‍යාවෙන් 32%ක් පමණ ප්‍රතිලාභ ලබා ඇත. අදාළ විස්තර 2 ඇමුණුමෙහි දක්වා ඇත.

2.6 ප්‍රසිද්ධ සම්මන්ත්‍රණ

2017 වසර තුළ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම සඳහා වර්තමාන තේමාවන් පිළිබඳ පහත දැක්වෙන විශේෂ සම්මන්ත්‍රණ පවත්වන ලදී.

- **තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ වැඩමුළුව හා අතත්‍ය සම්මන්ත්‍රණය**

  ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් තොරතුරු දැන ගැනීමේ අයිතියට අදාළ ගැටළු පිළිබඳ ඉන්දියානු අත්දැකීම් බෙදා ගැනීමේ අරමුණින් තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ වැඩමුළුවක් හා 2017 ජූනි මස සංවිධානය කරන ලදී. මෙම සම්මන්ත්‍රණය මෙහෙයවන ලද්දේ තොරතුරු සඳහා ප්‍රවේශය වැඩසටහනේ ඉන්දියානු සම්බන්ධීකාරකයකු හා දකුණු ආසියාව, අප්‍රිකාව හා කැරිබියානු තලාපය තුළ තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ ප්‍රධාන පොදු පුහුණු සම්පතක් වන වෙන්කටේෂ් නායක් මහතා විසිනි. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, ජන මාධ්‍ය අමාත්‍යාංශය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICT) හා තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ දේශීය විශේෂඥයෝ මෙම අවස්ථාවට සහභාගි වූහ.

- **"තීරණ ගැනීමට උපකාරී වන මෙවලමක් ලෙස ගෝලීය ස්ථානීයකරණ පද්ධතිය හා ද්‍රෝණ තාක්ෂණය" (Global Positioning System and Drone Technology as a Decision Support Tool) පිළිබඳ සම්මන්ත්‍රණය**

  බුද්ධි මණ්ඩලයක් ලෙස ශ්‍රී.ලංකා සංවර්ධන පරිපාලන. ආයතනයේ රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිධාරීන්ගේ සංගමය (Alumni Association of Graduates of SLIDA's Master of Public Management) මගින් "තීරණ සහාය මෙවලමක් ලෙස ගෝලීය ස්ථානීයකරණ පද්ධතිය හා ද්‍රෝණ තාක්ෂණය" ("Global Positioning System and Drone Technology as a Decision Support Tool") පිළිබඳ සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී. මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ අතිරේක මැනුම්පති විසින් මෙම දේශනය පවත්වන ලදී.

  බුද්ධි මණ්ඩලයක් ලෙස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිධාරීන්ගේ සංගමය (Alumni Association of Graduates of SLIDA's Master of Public Management) මගින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය හා හමුදාවන්හි විධායක තනතුරු දරන නිලධාරීන්ගේ කළමනාකරණ ධාරිතාව ඉහළ නැංවීම සඳහා දේශන මාලාවක් සංවිධානය කිරීමට යෝජනා කෙරිණි.



- **"තිරසර සංවර්ධන ඉලක්ක, විවෘත රාජ්‍ය හවුල්කාරීත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී රාජ්‍ය නිලධාරීන්" (Sustainable Development Goals" Open Government Partnership and Gender Sensitive Public Officers) පිළිබඳ වැඩමුළුව.**

ක්ෂේත්‍රයේ විශේෂඥයන් විසින් USAID හි සහාය ඇතිව "තිරසර සංවර්ධන ඉලක්ක, විවෘත රාජ්‍ය හවුල්කාරීත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී රාජ්‍ය නිලධාරීන්" (Sustainable Development Goals" Open Government Partnership and Gender) පිළිබඳ විශේෂ වැඩමුළුවක් සංවිධානය කෙරිණි.





- **ගුණාත්මකභාවයෙන් යුතු අමාත්‍ය මණ්ඩල සංදේශ හා අමාත්‍ය මණ්ඩල සටහන් සකස් කිරීම**

ගුණාත්මකභාවයෙන් යුත් අමාත්‍ය මණ්ඩල සංදේශ හා අමාත්‍ය මණ්ඩල සටහන් සකස් කිරීමේ කුසලතා වර්ධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ සහයෝගය ඇතිව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් අමාත්‍ය මණ්ඩල සංදේශ හා අමාත්‍ය මණ්ඩල සටහන් ඉදිරිපත් කිරීම පිළිබඳ ලේකම්වරුන් හා අමාත්‍යාංශවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා බුද්ධි කලම්බන සැසියක් සංවිධානය කරන ලදී. අමාත්‍ය මණ්ඩල ලේකම් සුමිත් අබේසිංහ මහතා විසින් මෙම අවස්ථාවේ මුලසුන හොබවන ලදී.



ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ තොරතුරු තාක්ෂණ අංශය මගින් පහත දැක්වෙන සම්මන්ත්‍රණ පවත්වන ලද අතර ඒ සඳහා රාජ්‍ය හා පුද්ගලික අංශයේ විධායක නිලධාරීහු රැසක් සහභාගි වූහ.

- **පෙරියස්වාමි මානි මහතා විසින් මෙහෙයවන ලද "Ransomware යනු කුමක්ද?" පිළිබඳ වන සම්මන්ත්‍රණය**

  විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ යටිතළ පහසුකම් අමාත්‍යාංශය හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) සහයෝගීතාව ඇතිව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් Ransomware පිළිබඳ ඊ රාජ්‍ය සම්බන්ධ සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී. End User Security Group, SOPHOS හි ප්‍රාදේශීය කළමනාකරු පෙරියස්වාමි මානි මහතා විසින් ප්‍රධාන දේශනය පවත්වන ලදී. ඔහු විසින් Ransomware ප්‍රහාර හේතුවෙන් සයිබර් අවකාශය තුළ මතු වී ඇති ආරක්ෂාව පිළිබඳ තර්ජන කෙරෙහි අවධානය යොමු කරන ලදී. CERT|CC ද මෙම සැසිවාරය සඳහා සහභාගි වූ අතර සයිබර් අවකාශයේ ආරක්ෂාවෙහි වැදගත්කම අවධාරණය කෙරිණි.

  සාකච්ඡාව අතරතුර විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ යටිතළ පහසුකම් අමාත්‍යාංශයෙහි ලේකම් වසන්ත දේශප්‍රිය මහතා විසින් රාජ්‍ය තොරතුරු වෙත සයිබර් ප්‍රහාර එල්ල වීමෙන් ආරක්ෂා කර ගැනීම සඳහා ජාතික ආරක්ෂක ප්‍රතිපත්තියක අවශ්‍යතාව අවධාරණය කරන ලදී. රාජ්‍ය අංශයේ ප්‍රධාන තොරතුරු නිලධාරීහු මෙම සැසිවාරයට සහභාගි වූහ.








- **ජොනතන් ඩි ලා මොට්ටේ මහතා විසින් ඩිජිටල් රාජ්‍ය පිළිබඳ සම්මන්ත්‍රණය මෙහෙයවීම**





- **ස්ටෙෆාන් කොෆේ මහතා විසින් ජංගම ජාල ඇගයීම පිළිබඳ සම්මන්ත්‍රණය මෙහෙයවීම**





- **සේවා විශිෂ්ඨත්වය සඳහා ධාරිතා සංවර්ධනය**



අග්‍රාමාත්‍ය කාර්යාලයේ සම්බන්ධීකරණය සහිතව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් "සේවා විශිෂ්ටත්වය සඳහා ධාරිතා සංවර්ධනය" පිළිබඳ රාජ්‍ය සේවා සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී. සිංගප්පූරු ජාතික විශ්ව විද්‍යාලය (Singapore National University), ජාත්‍යන්තර ටෙමසෙක් පදනම (Temasek Foundation International) හා සිංගප්පූරු සිවිල් සේවා විද්‍යාලය (Singapore Civil Service College) යන ආයතනයන්හි ජ්‍යෙෂ්ඨ නිළධාරීන් විසින් දේශන පවත්වන ලද අතර ප්‍රතිපත්ති සැලසුම් හා ආර්ථික සංවර්ධනය පිළිබඳ අමාත්‍ය ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා ආරාධිත අමුත්තා ලෙස මෙම අවස්ථාවට සහභාගි විය.





- **5 G සේවාවන් වැඩි දියුණු කිරීම**

විදුලි සංදේශ හා ඩිජිටල් යටිතළ පහසුකම් අමාත්‍යාංශයේ සහයෝගීතාව ඇතිව 5 G භාවිතා කිරීමෙන් ජංගම දුරකථන තාක්ෂණයේ සිදු කෙරෙන අනාගත නව්‍යකරණයන් සහ 5 G සේවාවන් වැඩි දියුණු කිරීම ඇතුළුව ජංගම දුරකථන භාවිතා කරන්නන් සඳහා වන ප්‍රතිලාභ පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩමුළුවක් 2017 අගෝස්තු මස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ දී පවත්වන ලදී. මෙම සන්සදය සඳහා Internet of Things (IOT) පිළිබඳ ඉදිරිපත් කිරීමක් ද ඇතුළත් විය.

රාජ්‍ය අංශයේ නිලධාරීන්, ජංගම දුරකථන සමාගම්වල නියෝජිතයන් හා පුද්ගලික අංශයේ සංවිධානයන්හි කාර්මික විශේෂඥයින් මෙම සන්සදය සඳහා සහභාගි වූහ.

- **"යහපත් නායකයා ආයතනයක් අති විශිෂ්ඨත්වය කරා ළඟාකරවන්නේ කෙසේද How Great Leader gets Organizations to Archive Extraordinary" යන්න පිළිබඳ වැඩමුළුව**

රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ 2016-2018 කණ්ඩායම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යයන පාසල මගින් "How Great Leader gets Organizations to Archive Extraordinary" පිළිබඳ වැඩමුළුවක් 2017 මාර්තු 25 දින පවත්වන ලද අතර එය මෙහෙයවන ලද්දේ මැලේසියාවේ කළමනාකරණ හා විද්‍යා විශ්ව විද්‍යාලයේ ආචාර්ය අලි හටිබි විසිනි.



- **"ශ්‍රී ලංකාවේ මානව සම්පත් කළමනාකරණ ප්‍රතිපත්තිය" පිළිබඳ ප්‍රසිද්ධ දේශනය**

ශ්‍රී ලංකාවේ මානව සම්පත් සංවර්ධන කවුන්සිලයේ සභාපති දිනේෂ් වීරක්කොඩි මහතා විසින් "ශ්‍රී ලංකාවේ මානව සම්පත් කළමනාකරණ ප්‍රතිපත්තිය" පිළිබඳ ප්‍රසිද්ධ දේශනයක් 2017 අප්‍රේල් මස පවත්වන ලදී. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිධාරීන්ගේ සංගමයෙහි ඉදිරි කටයුතු පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරිය සමග විශේෂ සාකච්ඡාවක් පවත්වන ලදී.

2.7 විදේශ පුහුණු ආයතන සමග හවුල්කාරිත්වය ඇතිව පවත්වන ඉගෙනුම් හා සංවර්ධන වැඩසටහන්

- **සිංගප්පූරුවේ Civil Service College හි හවුල්කාරිත්වය ඇතිව "සේවා විශිෂ්ටත්වය සඳහා ධාරිතා සංවර්ධනය" පිළිබඳ වැඩසටහනක් පවත්වන ලදී**

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සිංගප්පූරුවේ සිවිල් සේවා පාසලේ (Civil Service College) සහ ටෙමසෙක් පදනමේ (Temasek Foundation) සහයෝගය සහිතව "සේවා විශිෂ්ඨත්වය සඳහා ධාරිතා සංවර්ධනය" නම් වූ වැඩසටහනක් දිප ව්‍යාප්ත සේවාවන් වලින් තෝරා ගන්නා ලද නිළධාරීන් 70 දෙනෙකු සඳහා පවත්වන ලදී. මෙම නිලධාරීන් CSC හිදී සිය පුහුණුව අවසන් කර ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි දී "ව්‍යාපෘති කළමනාකරණය හරහා වෙනසක් ක්‍රියාත්මක කිරීම" හා "මධ්‍යම මට්ටමේ සිට තමන් හා අන් අය මෙහෙයවීම" (Leading from the Middle- Leading Self & Others) පිළිබඳ මොඩියුල කිහිපයක් හදාරන ලදී.





- **ඕස්ට්‍රේලියානු රජය මගින් ශ්‍රී ලාංකික පර්යේෂකයන් වෙත අධිශිෂ්‍යත්ව පිරිනැමීම (AAF)**

ඕස්ට්‍රේලියානු රජය විසින් පිරිනැමෙන අධිශිෂ්‍යත්ව වැඩසටහන යටතේ මොනෑෂ් විශ්ව විද්‍යාලය හා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සහයෝගීතාව මත සහ ඕස්ට්‍රේලියානු රජයේ විදේශ කටයුතු හා වෙළඳ දෙපාර්තමේන්තුව මගින් අරමුදල් සැපයෙන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ධාරිතා සංවර්ධන වැඩසටහන් මාලාවකි. 2016 ඕස්ට්‍රේලියානු රජය විසින් පිරිනැමෙන අධිශිෂ්‍යත්ව වැඩසටහන යටතේ පර්යේෂකයන් 15 දෙනෙකු ප්‍රතිලාභ ලැබූ අතර ඔවුන් විසින් "ශ්‍රී ලංකාවේ කාන්තා ව්‍යවසායකත්වය නංවාලීම" පිළිබඳ පර්යේෂණ සිදු කරනු ලැබීය. 2017 මුල් භාගයේ දී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පර්යේෂණයන්ගේ සොයාගැනීම් බෙදාහැරීම සඳහා වැඩසටහනක් සංවිධානය කරන ලද අතර මෙම අධිශිෂ්‍යත්ව වැඩසටහන මගින් ආදි විද්‍යාර්ථයින් 15 දෙනෙකු ප්‍රතිලාභ ලැබූහ.

ඕස්ට්‍රේලියානු රජය විසින් පිරිනැමෙන අධිශිෂ්‍යත්ව වැඩසටහන 17 (AAF 17) මගින් "ශ්‍රී ලංකාවේ ස්ථිරසාර සංවර්ධනය සඳහා පුද්ගලික අංශ සහභාගීත්වය: සාක්ෂි පදනම් වූ ප්‍රතිපත්තිය හා පරිචය" (Private Sector Engagement for Sustainable Development in Sri Lanka(Evidence based Policy and Practice) පිළිබඳ අවධානය යොමු කරන ලද අතර 2025 සඳහා රජයේ දැක්ම වන ස්වයං පෝෂිත රටක් සහ 2030 සඳහා දැක්ම වන ස්ථිරසර යුගයක් ළඟා කර ගැනීම සඳහා කටයුතු කිරීම පාදක කොටගෙන "2018 දී ශ්‍රී ලංකාව තුළ ආයෝජනයන් ඇති කිරීම" යන ගමන් මග සඳහා පහසුකම් සැලසීම පිළිබඳ අවධානය යොමු කරන ලදී. මෙම අධිශිෂ්‍යත්ව වැඩසටහන මගින් ඕස්ට්‍රේලියානු රජය විසින් පිරිනැමෙන අධිශිෂ්‍යත්ව වැඩසටහන යටතේ වන ශිෂ්‍යත්වලාභීන්හට ශ්‍රී ලංකාව සඳහා වඩා යහපත් අනාගතයක් ඇති කිරීමේ අරමුණින් සාක්ෂි පදනම් වූ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සාර්ථක දායකත්වයක් ලබා දීමට අවශ්‍ය න්‍යායාත්මක හා ප්‍රායෝගික පසුබිම සපයන ලදී.



2.8 නිලධාරීන් සඳහා සම්බන්ධීකරණය කරන ලද විදේශීය පුහුණු ආයතනයන්හි පුහුණු වැඩසටහන්

2017 වසර තුළ නිලධාරීන් 193 සඳහා පිළිගත් විදේශීය පුහුණු ආයතනයන්හි පහත පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය කරන ලදී.

වගු අංක viii

2017 වසර තුළ සම්බන්ධීකරණය කළ විදේශ පුහුණු වැඩසටහන්

පුහුණු වැඩසටහන	ස්ථානය	දිනයන්	සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව
රාජ්‍ය පරිපාලනය හා සංවර්ධනය පිළිබඳ පුහුණුව	ඉන්දියානු රජයේ කළමනාකරණ ආයතනය (Institute of Management in Government, India)	2017 ජූනි 12-16	30
ග්‍රාම නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන	ඉන්දියානු රජයේ කළමනාකරණ ආයතනය (Institute of Management in Government, India)		30
	ඉන්දියානු රජයේ කළමනාකරණ ආයතනය (Institute of Management in Government, India)	2017 ජූලි 10-14	30
නායකත්ව හා කළමනාකරණ පුහුණු වැඩසටහන	බ්‍රිතාන්‍ය සිවිල් සේවා විද්‍යාලය (Civil Service Academy, UK)	2017 ජූලි 10-14	13
විධායකයින් සඳහා පුහුණු වැඩසටහන	AIT, Thailand	2017 අගෝස්තු	30
විධායකයින් සඳහා පුහුණු වැඩසටහන	තායිලන්තයේ බැංකොක්හි ශ්‍රී පැතුම් විශ්ව විද්‍යාලය (Sripatum University in Bangkok" Thailand)		30
රාජ්‍ය ප්‍රතිපත්ති හා කළමනාකරළණය	at KDI School Korea	2017 සැප්තැම්බර් 17-23 දක්වා සහ ඔක්තෝම්බර් 15 - 21 දක්වා	30


SPU




INSTITUTE OF MANAGEMENT IN GOVERNMENT THIRUVANANTHAPURAM
Training Programme on Public Administration and Development for the senior Administrators of Govt. of Srilanka (12.06.2017 to 16.06.2017)


INSTITUTE OF MANAGEMENT IN GOVERNMENT THIRUVANANTHAPURAM
Training Programme on Public Administration and Development for the senior Administrators of Govt. of Srilanka
(10.07-2017 to 14.07.2017)


INSTITUTE OF MANAGEMENT IN GOVERNMENT THIRUVANANTHAPURAM
Training Programme on Public Administration & Development for
Senior Administrators of Govt. of Srilanka from 18.12.2017 to 22.12.2017


2017 Study Tour Program
for Sri Lankan All Island Services

2.8.1 විදේශීය ජාතිකයන් සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන්

- **ඉන්දුනීසියානු නිලධාරීන් සඳහා**


ශ්‍රී ලංකාව හා ඉන්දුනීසියාව - දක්ෂිණ සහයෝගීතා වැඩසටහන යටතේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් කාර්ය සාධනය මත පදනම් වූ අයවැය සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. ඉන්දුනීසියානු ජාතික සංවර්ධනය සැලසුම්කරණය පිළිබඳ අමාත්‍යාංශයෙහි (BAPPENAS), ඉන්දුනීසියානු ජනරජයේ ජාතික සංවර්ධන සැලසුම්කරණය පිළිබඳ අමාත්‍යාංශයෙහි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හත් දෙනෙක් සහ JICA ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ දෙදෙනෙක් ශ්‍රී ලංකාවේ කාර්ය සාධනය පදනම් වූ අයවැය සකස් කිරීම පිළිබඳ දෙරටෙහි අත්දැකීම් බෙදා ගැනීම කෙරෙහි අවධානය යොමු කෙරුණු මෙම පස් දින වැඩසටහනට සහභාගි වූහ.

මෙම වැඩසටහනේ දී කාර්ය සාධනය පදනම් වූ අයවැය සකස් කිරීම පිළිබඳ ශ්‍රී ලංකාවේ පරිචයන් අවබෝධ කර ගැනීමට හැකි වන පරිදි ප්‍රායෝගික අත්දැකීම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරිණි.



- **නේපාල ජාතික නිලධාරීන් සඳහා**

තවද 2017 ජූලි මස නේපාලයේ ජ්‍යෙෂ්ඨ රාජ්‍ය අංශ නිලධාරීන් 6 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහනක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ දී පවත්වන ලදී.




3. පශ්චාත් උපාධි අධ්‍යයන පාසල

2003 වසරේ දී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 1985 අංක 07 දරණ පනත මගින් සංශෝධිත 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 25ඒ වගන්තිය යටතේ පනවන ලද නියෝගය අනුව ශාස්ත්‍රපති උපාධි පිරිනැමීමේ තත්වය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත පිරිනමන ලදී. ඒ අනුව පශ්චාත් උපාධි අධ්‍යයන පාසල ස්ථාපිත කරන ලද අතර පසුව එම පාසල ජාතික, ප්‍රාදේශීය හා ජාත්‍යන්තර මට්ටමින් අඛණ්ඩව රාජ්‍ය අංශයේ වෘත්තිකයන් සමග කටයුතු කරන ලදී. රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි වැඩසටහන සකස් කිරීමට අදාළ තාර්කිකය පදනම් වූයේ වර්තමානයේ අමාත්‍යාංශයන්හි ලේකම්වරුන්, ප්‍රධාන විධායක නිලධාරීන් හා වෙනත් පාර්ශවකරුවන් ද එක සමානව තම කළමනාකරුවන්ගෙන් එකතු කරන ලද වටිනාකම් සහිත දායකත්වයක් අපේක්ෂා කරන ඉක්මනින් වෙනස් වන හා අභියෝගාත්මක රාජ්‍ය කළමනාකරණ පරිසරය මතයි. රාජ්‍ය කළමනාකරණය පිළිබඳ මෙම සුවිශේෂ පශ්චාත් උපාධි වැඩසටහන මගින් පශ්චාත් උපාධියක් ලබා ගැනීම සඳහා එය හදාරන්නන් දැනුමින් පෝෂණය කිරීම හා විවිධ කළමනාකරණ මට්ටම්වලදී ආත්ම විශ්වාසයෙන් යුතුව කටයුතු කිරීම සඳහා ඔවුන් කුසලතාවන්ගෙන් සන්නද්ධ කිරීම සිදු කෙරේ.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යයන පාසල මගින් පවත්වන රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි වැඩසටහන මෙරට ප්‍රධාන ප්‍රායෝගික පශ්චාත් උපාධි වැඩසටහනකි. ඒ අනුව එහි සහභාගිවන්නන් තෝරා ගැනීමේ ක්‍රියාවලිය, වැඩසටහනෙහි අන්තර්ගතය හා එය පවත්වන ආකාරය වෙනත් ඊට සමාන වැඩසටහන්වලට වඩා වෙනස් වන අතර සහභාගිවන්නන් සඳහා වෙනත් රටක ප්‍රායෝගික අත්දැකීම් ලබා ගත හැකි වන පරිදි එය සැලසුම් කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම වැඩසටහන සඳහා ලියාපදිංචි වීමට වෘත්තිකයන්ගේ ඉහළ ඉල්ලුමක් පවතින අතර එම සංඛ්‍යාව තව දුරටත් ඉහළ යමින් පවතියි.

වගු අංක iX

රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි වැඩසටහන සඳහා ලියාපදිංචි වූ සංඛ්‍යාව



2017 වසර ආරම්භයේ දී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යයන පාසල 2016 - 2018 කණ්ඩායම සඳහා අපේක්ෂකයන් 94 දෙනෙකු ලියාපදිංචි කරන ලද අතර එහි සමාරම්භක වැඩසටහන 2017 පෙබරවාරි මස 22 දිනදී පවත්වන ලදී. 2017 වසර තුළ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යයන පාසල මගින් රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි වැඩසටහන සඳහා කණ්ඩායම් තුනක් ඇතුළත් කරගෙන තිබූ අතර මුළු සිසුන් සංඛ්‍යාව 224ක් විය.

රාජ්‍ය ප්‍රතිපත්තිය, කළමනාකරණය හා පරිපාලනය පිළිබඳ ස්ව අත්දැකීමෙන් දැනුම උකහා ගැනීම සහ චීනයේ රාජ්‍ය පරිපාලනයේ හොඳම පරිචයන් ඉගෙන ගැනීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යයන පාසල මගින් 2017 දී ශාස්ත්‍රපති උපාධිධාරීන් සඳහා චීනයේ HUST විශ්ව විද්‍යාලය වෙත අධ්‍යයන චාරිකාවක් සංවිධානය කරන ලදී.

දැනුම නිර්මාණය කිරීම, යොදා ගැනීම, සංරක්ෂණය හා බෙදාහැරීම සඳහා කැප වෙමින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යයන පාසල මගින් "පර්යේෂණ පරිචයන් බවට පරිවර්තනය කිරීම: සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්ති සම්පාදනය පිළිබඳ සංසදය" යන මැයෙන් එහි වාර්ෂික පර්යේෂණ සිම්පෝසියම 2017 ජූනි 21 දින ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවෙදී පැවැත්වීමට කටයුතු සංවිධානය කරන

ලදී. මෙය ඉහත තේමාව යටතේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යයන පාසල මගින් සංවිධානය කරන ලද 3 වන වාර්ෂික සන්සදය වේ. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය ලැබූ ශ්‍රී ලංකා රේගු දෙපාර්තමෙන්තුවේ නිලධාරීන් හය දෙනෙකු විසින් ශ්‍රී ලංකා රේගුවට සම්බන්ධ "නැව් බඩු නිෂ්කාශනය සහ ප්‍රවාහන කාර්යක්ෂමතාව" සහ "මානව සම්පත් කළමනාකරණය හා පද්ධති ඵලදායීතාව" පිළිබඳ පර්යේෂණ නිබන්ධනයන් නිලධාරී මණ්ඩලයක් වෙත ඉදිරිපත් කරන ලදී.



උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යයන පාසල මගින් රාජ්‍ය අංශය සඳහා කාලීන වැදගත්කමකින් යුතු මාතෘකා පිළිබඳ සම්මන්ත්‍රණ සංවිධානය වැනි විශේෂ වැඩසටහන් පවත්වනු ලැබේ. මීට අදාළව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යයන පාසල මගින් 2017 මාර්තු මස "How great leader gets organizations to archive extraordinary" පිළිබඳ විශේෂ දේශනයක් සංවිධානය කරන ලද අතර එය මැලේසියාවේ කළමනාකරණ හා විද්‍ය විශ්ව විද්‍යාලයේ (Management & Science University) ආචාර්ය අලි කටිබි මහතා විසින් පවත්වන ලදී. "ශ්‍රී ලංකාවේ මානව සම්පත් කළමනාකරණ ප්‍රතිපත්තිය" පිළිබඳ දෙවන ප්‍රසිද්ධ දේශනය 2017 අප්‍රේල් මස මානව සම්පත් සංවර්ධන කවුන්සිලයේ සභාපති දිනේෂ් වීරක්කොඩි මහතා විසින් පවත්වන ලදී.

ඒකාබද්ධ සමාජ වගකීමක් පිළිබඳ ව්‍යාපෘතියක් ලෙස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් කොළඹ ජාතික රෝහලේ සහයෝගීතාව ඇතිව 2017 අප්‍රේල් මස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා සෞඛ්‍ය කඳවුරක් සංවිධානය කරන ලදී.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යයන පාසලේ අනාගත සංවර්ධනය සඳහා මූලපිරීම් සිදු කර ඇති අතර මෙම වැඩසටහන් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මක රාමුවට ගැලපීම සඳහා වැඩසටහනේ සහ මොඩියුලවල අන්තර්ගතය අඛණ්ඩව සංශෝධනය කරනු ලැබේ.

4. කළමනාකරණ උපදේශන

සංවිධානමය සංවර්ධන අංශය විසින් රාජ්‍ය අංශයේ ආයතන සඳහා කළමනාකරණ උපදේශනය සැපයීමට අදාළව කටයුතු කරනු ලැබේ. මෙම උපදේශනයන් සේවක සංඛ්‍යාවන්, ක්‍රියාවලීන් සමාලෝචනය හා අත්පොත් හා මාර්ගෝපදේශ සකස් කිරීම ආදිය සඳහා වේ. 2017 වසර තුළ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පහත දැක්වෙන සංවිධානමය සංවර්ධන සේවාවන් සපයන ලදී.

- විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ යටිතළ පහසුකම් අමාත්‍යාංශය සඳහා "ඩිජිටල් 2020 සඳහා දැක්ම" පිළිබඳ ලේඛනයක් සකස් කිරීම.
- සීමා සහිත ගුවන් තොටුල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම සඳහා කළමනාකරණ අධ්‍යයනයක් සඳහා යෝජනාව
- ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සඳහා කාර්යය අධ්‍යයනය

5. 2017 වසර තුළ පවත්වන ලද විභාග

2017 වසර තුළ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විභාග අංශය විසින් විභාග 131ක් පවත්වන ලද අතර ඒ අතරින් විභාග 98 ක් බාහිර ආයතන සඳහා වූ අතර ඉතිරි විභාග අභ්‍යන්තර වැඩසටහන් සඳහා විය.

බාහිර විභාගවලට ප්‍රධාන වශයෙන් කාර්යක්ෂමතා කඩඉම් විභාග සහ අභ්‍යන්තර උසස්වීම්වලට අදාළ විභාග ඇතුළත් විය. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් සමාලෝචිත කාල සීමාව තුළ පහත දැක්වෙන බාහිර හා අභ්‍යන්තර විභාග පවත්වන ලදී. මීට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ තොරතුරු තාක්ෂණ අංශයේ සහාය සහිතව මාර්ගගතව පවත්වන ලද විභාග 24 ක් ඇතුළත් විය.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් 2017 වසර තුළ පවත්වන ලද විභාග ඇමුණුම 3හි දැක්වේ.

6. පොදු පරිපාලනය

6.1 මානව සම්පත් කළමනාකරණය

පහත දැක්වෙන තනතුරු ද්විතීයන පදනම යටතේ පිරවීමට කටයුතු කරන ලදී

ජ්‍යෙෂ්ඨ උපදේශක	03
වැඩසටහන් නිලධාරී	02
කළමනාකරණ සහකාර	01
රියදුරු	01

ඉහත තනතුරුවලට අමතරව බංගලා භාරකරු තනතුර ස්ථිර පදනමින් පිරවීමට කටයුතු කරන ලදී.

පහත දැක්වෙන තනතුරු විශ්‍රාම ගැනීම, ඉල්ලා අස්වීම හා ද්විතීයන පදනම මත මුදා හැරි සේවා කාලය නිමා වීම හේතුවෙන් පුරප්පාඩු විය.

අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල්	02
ජ්‍යෙෂ්ඨ උපදේශක	01
අධ්‍යක්ෂ (මුදල්)	01
සහාය උපදේශක	01
වැඩසටහන් නිලධාරී	02
කළමනාකරණ සහකාර	03
රියදුරු	01

6.2 පහසුකම් සම්පාදන කළමනාකරණය

ආයතනයේ පහත දැක්වෙන ස්ථානයන් සමාලෝචිත වසර තුළ නැවත සකස් කර පිළිසකර කරන ලදී.

වගු අංක x

පිළිසකර කරන ලද අංශ සහ දරන ලද වියදම්

ස්ථානය	මුළු පිරිවැය (රු.)
නේවාසිකාගාරය	5,354,602.14
කුඩා ශ්‍රවණාගාරය	6,215,629.25
අධ්‍යනේන්ද්‍රිය	9,235,117.24
විදුලි පද්ධතිය	1,014,438.61
පර්යේෂණ මධ්‍යස්ථානය	9,060,970.82
නේවාසිකාගාර ගොඩනැගිල්ල	1,880,873.28

6.3 අභ්‍යන්තර ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අභ්‍යන්තර ක්‍රියාවලීන් ස්වයංක්‍රීය කිරීම සඳහා ආයතනයේ තොරතුරු තාක්ෂණ අංශයේ සහාය ඇතිව පහත දැක්වෙන මෘදුකාංග යෙදවුම් යොදා ගන්නා ලදී.

- පැමිණීම කළමනාකරණ පද්ධතිය සඳහා නව මොඩියුලය
- ශ්‍රී.ලං.සං.පරි. ආයතනයේ ගෙවුම් දොරටුව සඳහා නව මොඩියුලය
- ශ්‍රී.ලං.සං.පරි. ආයතනයේ වෙබ් අඩවි උත්ශ්‍රේණිගත කිරීම
- ශ්‍රී.ලං.සං.පරි. ආයතනයේ විභාග කළමනාකරණ පද්ධතිය
- ශ්‍රී.ලං.සං.පරි. ආයතනයේ විභාග සඳහා මාර්ගගත අයදුම්පත් ක්‍රියාවලි පද්ධතිය (Online Admission Processing System)
- තොරතුරු තාක්ෂණ අංශය සඳහා ගොණු කළමනාකරණ පද්ධතිය

6.4 තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම

සමාලෝචිත වසර තුළ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අභ්‍යන්තර ජාලය හා එහි දෘඩාංග යටිතල පහසුකම් වැඩි දියුණු කරන ලදී.

- පරිගණක උපකරණ සඳහා බාධාවකින් තොරව විදුලිය සැපයීම සඳහා මධ්‍ය UPS පද්ධතීන් සහිතව තොරතුරු තාක්ෂණ විද්‍යාගාරය 2 හා 3 යළි ස්ථාපිත කිරීම.
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පුස්තකාලය සඳහා RFID මුද්‍රණ පහසුකම් හඳුන්වා දීම.
- ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ සහාය ඇතිව පුස්තකාල ස්වයංකරන පද්ධතියක් (KOHA) යළි ස්ථාපනය කිරීම
- නව පරිගණක සර්වර දෙකක් මිළදී ගැනීම

7. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් ක්‍රියාත්මක කරන විශේෂ ව්‍යාපෘති

7.1 ගැටුම්වලින් බලපෑමට ලක් වූ ප්‍රදේශයන්හි ප්‍රජා සංවර්ධනයට අදාළ ඉදිරි පෙළ නිලධාරීන් සඳහා වූ JICA අරමුදල සැපයෙන වැඩසටහන (FORWARD Project)

FORWARD ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විය. 2017 සාර්ථක ලෙස නිම කෙරුණු FORWARD ව්‍යාපෘතියෙහි අරමුණ වූයේ ධාරිතා සංවර්ධනය හරහා ශ්‍රී ලංකාවේ ගැටුම්වලින් බලපෑමට ලක් වූ ප්‍රදේශවල - උතුරු, උතුරු මැද හා නැගෙනහිර පළාත්හි ඉදිරිපෙල රාජ්‍ය නිළධාරීන් විසින් සපයනු ලබන ප්‍රජා සත්කාර සේවාවනට අදාල රාජ්‍ය සේවාවන්ගේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමයි. මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයන ලද්දේ JICA ආයතනය මගිනි.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධීක්ෂණය හා මගපෙන්වීම යටතේ එක් එක් කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකකයන්ගේ අධ්‍යක්ෂවරුන් විසින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

ව්‍යාපෘති කාලය තුළ ඉදිරි පෙළ නිලධාරීන් 900 දෙනෙකුගේ ධාරිතා සංවර්ධනය කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය මගින් සැලසුම් කරන ලදී. කෙසේ වුවද, මෙම ඉලක්කය ඉක්මවා අදාල වසර තුලදී ඉදිරි පෙළ නිලධාරීන් 1315 දෙනෙකු පුහුණු කරන ලදී.





7.2 එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන් සහාය

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) මගින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය හරහා ධාරිතා සංවර්ධනය සහ දිස්ත්‍රික්ක 7ක සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් පාලනය ශක්තිමත් කරන ලදී. ප්‍රජා පාදක සංවිධාන සහ පලාත් පාලන බලධාරීන් මගින් කුඩා පරිමාණ සමාජ ආර්ථික සංවර්ධන ව්‍යාපෘති සඳහා පහසුකම් සැලසීම, තිරසර සංවර්ධනය සඳහා ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ සකස් කිරීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කෙරුණු ක්‍රියාකාරකම් කිහිපයකි.



තවද, මෙම ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පර්යේෂණ අංශය ස්ථාපිත කිරීම හා රාජ්‍ය අංශයේ නිලධාරීන් අතර පර්යේෂණ සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම සඳහා සහාය ලබා දෙන ලදී.



8. විශේෂ අවස්ථා

8.1 වසර 35ක උදාර සේවය සැමරීම

1982 දී ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය 35 වසරක උදාර සේවාවක් සම්පූර්ණ කරමින් 2017 මැයි මස තවත් සන්ධිස්ථානයක් කරා ළඟා විය. 35 වන සංවත්සරය සැමරීමේ උත්සවයක් සංවිධානය කෙරුණු අතර එයට සාමාජීය ක්‍රියාකාරකම්, සම්මන්ත්‍රණ, කථික තරඟ හා ශිෂ්‍යත්ව/ සහතික පත් පිරිණැමීම ආදිය ඇතුළත් විය. තවද ආයතනය විසින් පිළිකා රෝගීන් නේවාසිකව සිටින "ශාන්ත සෙවණ" වෙත ගොස් පිළිකා රෝගීන් සඳහා ඖෂධ හා වියළි සලාක ලබා දෙන ලදී.

මෙම සැමරුම අවසන් වූයේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත අගනා සේවයක් ඉටු කරන ලද එහි හිටපු අධ්‍යක්ෂවරුන්/ අධ්‍යක්ෂ ජනරාල්වරුන් සඳහා පවත්වන ලද අභිනන්දන වැඩසටහනකිනි. මෙහි ප්‍රධාන අමුත්තා වූයේ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍ය ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමායි.



රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍ය, අමාත්‍යාංශ ලේකම්, ශ්‍රී.ලං.ස.පරි.ආ.හි අධ්‍යක්ෂ ජෙනරාල් සහ හිටපු සියළු අධ්‍යක්ෂ ජනරාල්වරුන් සංවත්සර සැමරුමේදී



ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා විසින් උත්සවයේ දී සාම්ප්‍රදායික පොල් තෙල් පහන දැල්වීම

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 35 වන සංවත්සරය සැමරීම වෙනුවෙන් සිදු කරන ලද ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන පරිශ්‍රය පිරිසිදු කිරීමේ ශ්‍රමදානය සහ මහරගම ශාන්ත සෙවණ වෙත ආධාර ලබා දීම යන වැඩසටහන්හි විශේෂ අවස්ථා







8.2 GREEEN ව්‍යාපෘතිය සඳහා ජාතික හරිත බලශක්ති ශූරතාව දිනා ගැනීම. (පුනර්ජනනීය බලශක්ති සහ බලශක්ති කාර්යක්ෂමතා ජාලකරණ ව්‍යාපෘතිය.)

ජර්මනියේ Deutshe Gesellschaft fur Internationale Zusammenarbeit (GIZ) සංවිධානය හරහා විදේශ කටයුතු අමාත්‍යාංශය සහ විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද තරගාවලියේදී ඉතා තරගකාරී තෝරාගැනීමේ ක්‍රියාවලියකින් අනතුරුව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් එහි "හරිත බලශක්ති ශූරතා සම්මානය" දිනාගන්නා ලදී.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි හරිත ව්‍යාපෘතියට එම ආයතනය තුළ ක්‍රියාවට නංවන ලද පහත සඳහන් හරිත මූලාරම්භයන් ඇතුළත් විය.

- 72 kw ධාරිතාවෙන් යුත් සූර්‍ය බලශක්ති පද්ධතිය කිරීම.
- නාගරික කොම්පෝස්ට් නිෂ්පාදන ඒකකයක් පිහිටුවීම.
- නේවාසිකාගාරයේ දොරවල් සඳහා RFID අගුළු සවි කිරීම.
- පන්ති කාමරවල විදුලි අධීක්ෂණ පද්ධතිය
- පරිසර අධීක්ෂණ පද්ධතිය
- ජීව වායු ඒකකය





8.3 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යයන පීඨ ගොඩනැගිල්ල විවෘත කිරීම.

අවම ඉඩ පහසුකම් සහිත කාර්යාල කාමර බෙදා ගනිමින් සේවයේ යෙදී සිටි ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් හට නවීන පහසුකම්වලින් සමන්විත කාර්යාල පහසුකම් ආයතනයේ අධ්‍යයන පීඨ ගොඩනැගිල්ල තුළ සපයා දෙන ලදී. නව පීඨ ගොඩනැගිල්ල සම්මන්ත්‍රණ ශාලාවක්, සාකච්ඡා / හමු පැවැත්වීම සඳහා විවෘත ප්‍රදේශයක්, කියවීම් ශාලාවක් සහ උපදේශකවරුන්ගේ කුටි යනාදියෙන් සමන්විත වේ.





8.4 තිරසර ලංකා ප්‍රදර්ශනය

අතිගරු ජනාධිපතිතුමන් විසින් විවෘත කරන ලද, 2017 මාර්තු 31 සිට අප්‍රේල් 04 දක්වා බණ්ඩාරනායක අනුමස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවති තිරසර ලංකා- තිරසාර සංවර්ධනය පිළිබඳ ප්‍රදර්ශනයට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සහභාගී වුණි. එහිදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ හරිත මූලාරම්භයන් සහ ආයතනය විසින් සපයනු ලබන සේවාවන් ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කරන ලදී.





8.5 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත දකුණු ආසියාවේ කළමනාකරණ පුහුණු ආයතනවල ප්‍රධානීන්ගේ පැමිණීම.

සහතික ලත් වෘත්තීය කළමනාකරුවන්ගේ කලාපීය සම්මන්ත්‍රණය - 2017ට සහභාගී වුණු දකුණු ආසියාවේ කළමනාකරණ පුහුණු ආයතනවල ප්‍රධානීන්ගේ නියෝජිත පිරිසක් සහ දකුණු ආසියානු කළමනාකරණ සංවර්ධන ආයතන සංගමයේ සාමාජිකයෝ 2017 සැප්තැම්බර් 26 වන දින ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත සුහද අධ්‍යන චාරිකාවක් සඳහා පැමිණියහ. රාජ්‍ය අංශයේ ධාරිතාව සංවර්ධනය කිරීමට අදාළ අනාගත පුහුණු හා පර්යේෂණ සම්බන්ධයෙන් ආයතන අතර සහයෝගීතාව පිළිබඳ නියෝජිත පිරිස විසින් සාකච්ඡා කරන ලදී.

දකුණු ආසියානු කළමනාකරණ සංවර්ධන ආයතන සංගමයේ සභාපති ශතිෆ් අලි මහතා, අහමදබාද්හි ඉන්දියානු කළමනාකරණ ආයතනයේ අධ්‍යක්ෂ, මහාචාර්ය එරල් ඩී සූසා සහ සාමාජික ආයතනවල ප්‍රධානීන්

මෙම නියෝජිත පිරිස අතරට ඇතුළත් වුණු අතර දකුණු ආසියානු කළමනාකරණ සංවර්ධන ආයතන සංගමයේ හිටපු සභාපති සහ සහතික ලත් වෘත්තීය කළමනාකරුවන්ගේ සභාපති, මහාචාර්ය ලක්ෂ්මන් ආර්. වටවල මහතාගේ මූලිකත්වයෙන් එය පැවැත්වුණි.



දකුණු ආසියාවේ කළමනාකරණ පුහුණු ආයතනවල ප්‍රධානීන් සහ දකුණු ආසියානු කළමනාකරණ සංවර්ධන ආයතන සංගමයේ සාමාජිකයින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේදී.

8.6 චීනයේ Huazhong තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පිරිසකගේ පැමිණීම

චීනයේ Huazhong තාක්ෂණ විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම වැඩි දියුණු කිරීමේ අරමුණින් චීනයේ Huazhong තාක්ෂණ විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරු කණ්ඩායමක් 2017 ජනවාරි 10 වන දින ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත පැමිණියහ. Huazhong තාක්ෂණ විශ්වවිද්‍යාලයටත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයටත් අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රයෝජනවත් වන ශාස්ත්‍රීය හා පුහුණු සහ ඉගෙනුම් යන විෂය ක්ෂේත්‍ර පිළිබඳ එහිදී දෙපිරිස අතර සාකච්ඡා පැවැත්විණි.

තවද, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වනු ලබන රාජ්‍ය කළමනාකරණපති පශ්චාත් උපාධි පාඨමාලාවෙහි ඉහලම දක්ෂතා දක්වන තැනැත්තා හට ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා පූර්ණ ශිෂ්‍යත්වයක් 2018 වසරේ සිට පිරිනමන බව Huazhong තාක්ෂණ විශ්වවිද්‍යාලය එහිදී තහවුරු කළේය. රාජ්‍ය කළමනාකරණපති පශ්චාත් උපාධි පාඨමාලාවට සහභාගී වන පිරිස සඳහා චීනයේ රාජ්‍ය ප්‍රතිපත්තිය, කළමනාකරණය හා පරිපාලනය සහ රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍ර තුළ යොදා ගැනෙන හොඳම භාවිතයන් පිළිබඳ ස්ව අත්දැකීමෙන් දැනුම උකහා ගැනීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යයන පාසල විසින් සංවිධානය කරන ලද අධ්‍යයන චාරිකාවක් අතරතුරදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය සමග පැවති හමුවකදී Huazhong තාක්ෂණ විශ්වවිද්‍යාලය විසින් ඒ බව ප්‍රකාශයට පත් කරන ලදී.



Meeting with the President of HUST University with Senior Public Officials

8.7 චීනයේ ජිනෑන් විශ්වවිද්‍යාලයේ පිරිසකගේ පැමිණීම

චීනයේ ජිනැන් විශ්වවිද්‍යාලයේ උප සභාපති සහ මහාචාර්යවරු පිරිසක්, එම විශ්වවිද්‍යාලයටත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයටත් අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රයෝජනවත් වන විෂය ක්ෂේත්‍රයන්හි ඇතිකරගත හැකි සහයෝගීතාව පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත පැමිණියහ.



ජිනැන් විශ්වවිද්‍යාලයේ උප සභාපති සහ ජෙෂ්ඨ කාර්යමණ්ඩලය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් හමුවූ අවස්ථාව

8.8 ගංවතුර සහනාධාර

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සුභ සාධක සංගමය විසින් ගංවතුරෙන් විපතට පත් වූවන් සඳහා 2017.05.27 වන දින ගංවතුර සහනාධාර බෙදා දීමට කටයුතු කරන ලදී.







8.9 රුක් රෝපණය

රුක් රෝපණ දිනය සැමරීම සඳහා පැළ සිටුවීමේ වැඩසටහනක් ආයතන පරිශ්‍රයේදී පවත්වන ලදී.



8.10 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කාර්යමණ්ඩලය සඳහා බැහැරගත පුහුණු වැඩසටහන.

මාදුරු ඔය ශ්‍රී ලංකා යුද හමුදා විශේෂ කාර්ය බලකා කඳවුරේදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කාර්යය මණ්ඩලය සඳහා බැහැරගත පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.







8.11 ශරීර සුවතා දිනය

ශරීර සුවතා දිනය සැමරීම සඳහා වැඩසටහනක් 2017 පෙබරවාරි 02 වන දින ආයතන පරිශ්‍රය තුළ පවත්වන ලදී.






8.12 වෙසක් උත්සව සැමරුම්

වෙසක් පොහොය දිනය සැමරීම සඳහා ආයතන පරිශ්‍රය තුළ ධර්ම දේශනා පිංකමක් පශ්චාත් උපාධි අධ්‍යයන පාසලේ දී විද්‍යාර්ථීන් විසින් සංවිධානය කරන ලදී.







III කොටස

නව මූලාරම්භයන් 2017

3.1 උපායමාර්ගික සැලැස්ම 2017 2021

වෙනස් වන පරිසරය සහ සෑම කල්හිම වෙනස් වෙමින් පවතින රාජ්‍ය අංශයේ සේවාවන් සඳහා වන ඉල්ලුම සැලකිල්ලට ගෙන, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් එහි දැක්ම වන ආසියාවේ ඉගෙනුම් සහ සංවර්ධනය පිළිබඳ සුවිශිෂ්ටතම මධ්‍යස්ථානය බවට පත්වීම් අත්කර ගැනීම සඳහා එහි උපායමාර්ගික සැලැස්ම ඊලඟ වසර 5 (2017-2021) අරමුණු කොට සංවර්ධනය කරන ලදී.

උපායමාර්ගික දිශානතිය සහ පස් වසරක සැලැස්ම වනාහී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ නායකත්වය සහ එහි කළමනාකරණ කණ්ඩායම විසින් දරන ලද ප්‍රයත්නයන්හි ප්‍රතිඵලයකි. මෙම ක්‍රියාවලිය තුළින් පහත සඳහන් ගැටලු කෙරෙහි අවධානය යොමු කෙරේ;

1. ආයතනයක් වශයෙන් අපි කවුරුන්ද, වත්මන් සන්දර්භය තුළට අපි අදාළ වන්නේ කෙසේද?
2. වත්මන් ප්‍රවණතා සැලකිල්ලට ගැනීමේදී අනාගතය කෙබඳු වේද?
3. වර්තමානයේ අප සතුව පවතින ශක්තීනට අමතරව අප විසින් සංවර්ධනය කර ගත යුතු නව හැකියාවන් කවරේද?
4. අපට යාමට අවශ්‍ය වන්නේ කොතැනටද?
5. අපි එතැනට යන්නේ කෙසේද?

මෙම සැලැස්මෙහි අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා යා යුතු මාර්ගය ඉහත ප්‍රශ්නවලට පිළිතුරු දීම මගින් අනුරූපණය වේ. ආසියාවේ රාජ්‍ය අංශයේ ඉගෙනුම් හා සංවර්ධන කටයුතු පිළිබඳ විශිෂ්ටතම මධ්‍යස්ථානය බවට පත්වීමේ අපේක්ෂාව මුදුන්පත් කරගැනීම සඳහා අප විසින් සපයනු ලබන සේවාවන්හි හා සිදු කරනු ලබන පර්යේෂණයන්හි ගුණාත්මක භාවය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ. තවද, අපගේ අරමුණ කරා යන ගමනේ ප්‍රගතිය මැනීම සඳහා වන අභිලාශයද අපගේ පරමාර්ථය සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය වන සාධකයකි.

3.2 නව ඩිප්ලෝමා වැඩසටහන්/ පුහුණු වැඩසටහන් හඳුන්වාදීම.

3.2.1 රාජ්‍ය ප්‍රසම්පාදන හා ගිවිසුම් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් එහි ප්‍රථම උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා වැඩසටහන 2017 වසරේ අගෝස්තු මාසයේදී ආරම්භ කරන ලදී. මෙම රාජ්‍ය ප්‍රසම්පාදනය සහ ගිවිසුම් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව මාස 14 ක් පුරා දිවෙන අර්ධ කාලීන පාඨමාලාවක් වශයෙන් පැවැත්වීමට නිර්මාණය කරනු ලැබ ඇත. බොහෝ රාජ්‍ය ආයතන නියෝජනය කරන නිලධාරීහු මෙම පාඨමාලාව හැදෑරීම සඳහා ලියාපදිංචි වී සිටිති.

මෙම පාඨමාලාව පැවැත්වීමේ අරමුණ වනුයේ ප්‍රසම්පාදනය සහ ගිවිසුම් පරිපාලනය යන විෂයයන් සම්බන්ධයෙන් රාජ්‍ය අංශයේ කළමනාකරුවන්ගේ න්‍යායාත්මක දැනුම වර්ධනය කිරීම සහ එය ක්‍රියාවට නැංවීමේදී අත්දැකීමට සිදුවන අභියෝගයනට ශක්තිමත්ව මුහුණදීමට ඔවුන් පුහුණු කිරීමයි.

3.2.2 ජාතික ආරක්ෂාව සහ ගෝලීය පාලනය

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ජාත්‍යන්තර සබඳතා හා ආරක්ෂාව පිළිබඳ අධ්‍යයනය යන විෂයයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පවතින ප්‍රමුඛ පෙළේ බුද්ධි මණ්ඩල ආයතන ද්විත්වයක් වන ජාත්‍යන්තර අධ්‍යයනයන් පිළිබඳ බණ්ඩාරනායක මධ්‍යස්ථානයේ සහ පාත්ෆයින්ඩර් ආයතනයේ සහයෝගීත්වය සහිතව "ජාතික ආරක්ෂාව සහ ගෝලීය පාලනය" යන මැයෙන් දේශන මාලාවක් ශ්‍රී ලංකා පරිපාලන සේවය නිලධාරීන් වෙනුවෙන් පවත්වන ලදී. එහි සමාරම්භක දේශනය "ගෝලීය පාලනයේ ප්‍රගමනය" යන මැයෙන් බංග්ලාදේශ මහ කොමසාරිස් අතිගරු රියාස් හම්දුල්ලා මහතා විසින් පවත්වන ලදී.

3.2.3 ජාතිය ගොඩ නැංවීම සහ සමාජ ඒකාබද්ධතාව

සාමය ඇතිකිරීම, ප්‍රතිසන්ධානය සහ සමාජ ඒකාබද්ධතාව යන කාරණාවලදී පරිපාලකයෙකුගේ කාර්යභාරය අවබෝධ කරගැනීම සඳහා ජාතිය ගොඩ නැංවීම සහ සමාජ ඒකාබද්ධතාව පිළිබඳ මොඩියුලය ශ්‍රී ලංකා ගුවන් හමුදා නිලධාරීන් වෙත හඳුන්වා දෙන ලදී. මෙම මොඩියුලය සඳහා සහසත්කාරකත්වය ජනවාර්ගික අධ්‍යයනයන් පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානය සහ ජාත්‍යන්තර අධ්‍යයනයන් පිළිබඳ බණ්ඩාරනායක මධ්‍යස්ථානය විසින් දරන ලදි.

3.2.4 තිරසාර සංවර්ධන ඉලක්ක, විවෘත රාජ්‍ය සහභාගීත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී රාජ්‍ය නිලධාරීන්.

තිරසාර සංවර්ධන ඉලක්ක, විවෘත රාජ්‍ය සහභාගීත්වය (Open Government Partnership) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී රාජ්‍ය නිලධාරීන් (Gender Sensitive Public Officers) යන තේමා පිළිබඳ වැඩමුළුවක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන එක්සත් ජනපද නියෝජිතායතනයේ (USAID) සහයෝගීතාව ඇතිව 2017 ජුනි මස පවත්වන ලදී. වැඩමුළුවේ ප්‍රධාන අරමුණ වූයේ තිරසාර සංවර්ධන ඉලක්ක, විවෘත රාජ්‍ය සහභාගීත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී රාජ්‍ය නිලධාරීන් යන විෂයයන් පිළිබඳ දැනුම හා අවබෝධය වැඩි දියුණු කිරීමයි. 2017 වසරේදී බඳවාගන්නා ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් 130 ක් මෙම වැඩමුළුවට සහභාගී වූහ. අදාළ අංශවල විශේෂඥයින් විසින් දේශන පවත්වන ලද මෙම වැඩමුළුවේ සමාරම්භය සඳහා ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන එක්සත් ජනපද නියෝජිතායතනයේ, අවදානමට ලක්වන ජනගහනයන් පිළිබඳ කාර්යාලයේ (Office of Vulnerable Populations) අධ්‍යක්ෂිකා ඩැනියෙල් රයිප් මෙනවිය සහ ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ හිටපු ලේකම් සහ ප්‍රධාන විධායක නිලධාරිනී ධාරා විජයතිලක මහත්මිය සහභාගි වූහ.

3.2.5 විශ්‍රාම වැටුප් ලිපි ගොනු සකස්කිරීම පිළිබඳ පුහුණුව

දිගු කලක සිට පැවති අවශ්‍යතාවක් සපුරාලමින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණය සහිතව විශ්‍රාම වැටුප් ලිපි ගොනු සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන් මාලාවක් අමාත්‍යාංශයන්හි කළමනාකරණ සහ කළමනාකරණ නොවන සේවක මණ්ඩලය සඳහා පවත්වන ලදී. මේ වන විට රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ, ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සහ තවත් අමාත්‍යාංශ කිහිපයක නිලධාරීන් මෙම ප්‍රායෝගික පුහුණුව වෙතින් ප්‍රතිලාභ ලබා ඇත.



3.2.6 ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් සඳහා Toast Masters සංගම්

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන ඉතිහාසයේ ප්‍රථම වතාවට, අමාත්‍යාංශ අතිරේක ලේකම්වරු සඳහා ඔවුන්ගේ කථන හැකියාව වැඩි දියුණු කිරීමට Toast Masters සංගම් ආරම්භ කර තිබේ. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් Regelia International ආයතනය හා එක්ව පවත්වනු ලබන මෙම වැඩසටහන විශාල සාර්ථකත්වයක් අත්

කරගනිමින් තිබෙන අතර නිලධාරීන් අතර ජනප්‍රිය වෙමින් පවතියි. මෙම සේවාව වැඩි පිරිසක් වෙත ගෙන යාම සඳහා පුළුල් කිරීමට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය බලාපොරොත්තු වේ.

මෙම වැඩසටහන මගින් එයට සහභාගිවන පිරිස සඳහා මහජන ආමන්ත්‍රණය, ශ්‍රවණය, meeting protocol, ඉදිරිපත් කිරීම්වලදී තාක්ෂණය භාවිතය සහ සම්මන්ත්‍රණ හා හමුවලදී ඵලදායී සන්නිවේදනය යනාදිය හා සම්බන්ධ අධ්‍යාපනික මෙවලම් හා ද්‍රව්‍ය සහ සම්පත් විශාල ප්‍රමාණයක් භාවිතා කිරීමට අවස්ථාව සලසා දේ. එමෙන්ම, සන්නිවේදනය, නායකත්වය, සංගමයේ ක්‍රියාකාරකම් සහ අදාළ අනෙකුත් මාතෘකා පිළිබඳ මනා දැනුමක් සපයන මාසික සඟරාවක් වන Toastmaster නොමිලේ ලබා දේ. මෙම පහසුකම රාජ්‍ය අංශයේ අනෙකුත් තල වෙතද ගෙන යාමට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය අපේක්ෂා කරයි.

3.2.7 දූරදර්ශීභාවය ඇතිකරගැනීම සඳහා ක්‍රීඩා මත පදනම් වූ පුහුණුව.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි සහාය ඇතිව රාජ්‍ය අංශය සඳහා දූරදර්ශී භාවය සහ නව්‍යකරණය පිළිබඳ පුහුණු මොඩියුලයක් හා වැඩමුළු සංවර්ධනය කර ඇත.



රාජ්‍ය අංශයේ අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි සකස් කරන ලද මෙම වැඩමුළු, රටෙහි තිරසාර සංවර්ධන ක්‍රියාවලිය ඉදිරියට සිදුකරගෙන යාම සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සේවාරම්භක පුහුණුව ලබන නිලධාරීන් සහ එම සේවයේ I පන්තියේ නිලධාරීන් ශක්තිමත් කිරීමේත් යොමු කිරීමේත් අරමුණින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය තුළ පැවැත්වේ. ගෝලීය වශයෙන් මෙම විෂයය ක්ෂේත්‍රය තුළ සිටින ප්‍රවීණයන් වන ඉන්දියාවේ Fields of View ආයතනය මගින් මෙම වැඩමුළු පවත්වන ලදි .

කඩිසර බව ඇතිකිරීමට හා සර්වග්‍රාහී සංවර්ධන තීරණ ගැනීමට අවස්ථාව සලසන මෙන්ම ඵලදායී ප්‍රතිපත්ති සැලසුම් කිරීම සඳහා සහාය වන ආකාරයේ සංවර්ධන තීරණ ගැනීම සඳහා විවිධ ආදර්ශක භාවිතා කරන්නේ කෙසේද යන්න ශ්‍රී ලාංකීය සන්දර්භය තුළට අනුගත වන පරිදි සකස් කරන ලද කළමනාකරණ ක්‍රීඩා සහ අනුරූපණ අභ්‍යාස තුළින් සහභාගීවන්නන්ට අවබෝධ කරදෙන අයුරින් මෙම පුහුණු වැඩමුළු නිර්මාණය කර ඇත.

3.2.8 ජංගම පුහුණු වැඩසටහන්

2017- 2021 උපායමාර්ගික සැලැස්මේ උපායමාර්ගික මූලාරම්භයක් වශයෙන්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් විශාල පිරිසකට ප්‍රතිලාභ සැලසීමේ අරමුණින් ජංගම පුහුණු සේවාවක් ආරම්භ කරන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් නැගෙනහිර පළාත් සභාවේ කළමනාකරණ හා සංවර්ධන පුහුණු ඒකකයන්හි (MDTU) සහයෝගය ඇතිව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ජංගම පුහුණු සේවාවක් ආරම්භ කරන ලදී.



3.3 පර්යේෂණ මූලාරම්භයන්

3.3.1 "සන්ධරණී පර්යේෂණ මධ්‍යස්ථානය" පිහිටුවීම



රාජ්‍ය අංශයේ නිලධාරීන් විසින් සිදු කරනු ලබන පර්යේෂණ සඳහා අති නවීන පහසුකම් සැලසීමේ අරමුණින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් සන්ධරණී පර්යේෂණ මධ්‍යස්ථානය ස්ථාපනය කරන ලදී. පර්යේෂණ සිදු කිරීම හා ඒ සඳහා පහසුකම් සැලසීම යන කාර්යයන්හිදී අනෙකුත් පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථාන සමග ජාලගත වීමට මෙම මධ්‍යස්ථානය සැලසුම් කරයි. එමෙන්ම, සාක්ෂි මත පදනම්ව ප්‍රතිපත්ති සම්පාදනය සිදු කිරීම සහතික කිරීම සඳහා පර්යේෂණ මගින් සොයාගන්නා ලද තොරතුරු ප්‍රතිපත්ති සම්පාදකයින් වෙත ගෙන යාම සඳහා වේදිකාවක් සපයාදීමට ද එය සැලසුම් කරයි.

3.3.2 පර්යේෂණ ප්‍රකාශන



පහත පර්යේෂණ දෙක මගින් සොයාගත් කරුණු ඇතුළත් කොට "Applied Research with Agency Partnership-Arriving at Better Policy Recommendations" යන මැයෙන් ප්‍රකාශනයක් නිකුත් කරන ලදී.

- 'විධාතා මධ්‍යස්ථානවල' පුහුණු වැඩසටහන් සඵලදායී තාක්ෂණය වෙත මාරු කිරීම් භාවිතයි.
- පවතින පාසල් විෂය ධාරාවන් ගණිතය විෂයයට අදාළ වන්නේ කෙසේද යන්න සහ ගණිතය විෂයයේ පහළ දක්ෂතා දක්වන සිසුන්ගේ උසස් ප්‍රතිඵල ලැබීම සඳහා ඉගැන්වීම් හා ඉගෙනුම් ක්‍රමවේදයන්හි බලපෑමක් තිබේද යන්න.

3.3.3 ඔස්ට්‍රේලියානු අධි ශිෂ්‍යත්ව ප්‍රදාන වැඩසටහන

මොනෑෂ් විශ්ව විද්‍යාලය සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය අතර ඇති කර ගන්නා ලද සාමූහික එකඟතාවය මත, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ධාරිතා සංවර්ධන මැඩසටහන් මාලාවක් පවත්වනු ලබන ක්‍රියාවලියක් වන මෙහි අරමුදල් සපයනුයේ ඔස්ට්‍රලියානු රජයේ විදේශ කටයුතු හා වාණිජ දෙපාර්තමෙන්තුව විසිනි. මෙම වැඩසටහන මගින් පර්යේෂකයින් 15 දෙනෙකු ප්‍රතිලාභ ලබා ඇති අතර "ශ්‍රී ලංකාවෙහි කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධනය" යන විෂයය යටතේ පර්යේෂණ කටයුතුවල නිරතව සිටිත්. මෙම අධි ශිෂ්‍යත්ව වැඩසටහන මගින් ශිෂ්‍යත්ව ලාභීන් වෙත න්‍යායාත්මක සහ ප්‍රායෝගික පසුබිම සකස්කර දෙනු ලබන අතර, ඔවුන් මවී බිම වෙත පැමිණ එම දත්ත පදනම් කරගනිමින්, සමෘද්ධිමත් අනාගත ශ්‍රී ලංකාවක් බිහිකිරීම පිණිස ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා සාර්ථක අන්දමින් තම දායකත්වය සපයනු ඇත.

3.4 රාජ්‍ය අංශයේ නිලධාරීන් සඳහා උපදේශන සේවාවක් ආරම්භ කිරීම

රාජ්‍ය අංශයේ නිලධාරීන් තුළ ආතතිය දුරු කොට ආයතනික මෙන්ම පුද්ගලික ජීවිතයේ අභියෝගවලට මුහුණ දීමට ඔවුන් සවිබල ගැන්වීම තුළින් ඔවුන් වෙතින් සැපයෙන සේවාවන් වැඩි දියුණු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් රාජ්‍ය අංශයේ නිලධාරීන් වෘත්තීය උපදේශන සේවා සපයන්නන් හා සම්බන්ධ කරමින් ඔවුන් සඳහා උපදේශන සේවා සලසා ඇත. මෙහිදී, වෘත්තීය උපදේශන සේවා සපයන සංවිධාන පිළිබඳ තොරතුරු නිලධාරීන් වෙත සපයනු ලබන වේදිකාවක් වශයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය කටයුතු කරයි.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් දියත් කරන ලද මෙම කාර්යය ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවා ඉතිහාසයේ අද්විතීය ප්‍රයත්නයකි.

නිලධාරියාට තමා තුළ පවතින ආතතියෙන් මිදීම සඳහා අවස්ථාව සලසා දිය හැකි නිර්විනිශ්චිත, ප්‍රියමනාප, අන්‍යයන්ව අවබෝධ කරගත හැකි සහ සානුරෝධී උපදේශකයෙකු සමග පීඩාකාරී අවස්ථාවන්හිදී තමාට ඇතිවන හැඟීම් පිළිබඳ විශ්වාසයෙන් යුතුව සාකච්ඡා කිරීමට රාජ්‍ය අංශයේ නිලධාරීන්ට මෙමගින් අවස්ථාව සැලසෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

3.5 ISO තත්ව සහතික ලබාගැනීම සඳහා මූලාරම්භයන්

ඉහත අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වැඩසටහන් අංශය විසින් එස් පහ ක්‍රමය පිළිබඳ අත්පොතක් සහ බැහැරලීම හා සම්බන්ධ ප්‍රතිපත්තිය පිළිබඳ අත්පොතක් සකස් කිරීම ආරම්භ කර ඇත. එස් පහ (සෙයිරි, සෙයිතෝන්, සෙයිසෝ, සෙයිකෙත්සු හා ෂිත්සුකේ) ක්‍රියාත්මක කිරීම සඳහා වන ප්‍රධාන අවශ්‍යතා, එස් පහ ක්‍රමය පිළිබඳ අත්පොත තුළ අඩංගු වන අතර දෙවන අත්පොත මගින් එක් එක් අංශ විසින් ඒවායේ පැරණි හා අනවශ්‍ය ලිපි ගොනු බැහැර කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රමවේදය ඉදිරිපත් කෙරේ. 2018 වසරේ මැද භාගය වනවිට අදාළ ප්‍රමිතීන් අත්පත් කරගැනීම සඳහා ආතනයේ සියලු අංශ එක්ව කටයුතු කරමින් සිටී. දිගු කාලීන සහ කෙටි කාලීන වැඩසටහන් නිසි පරිදි ක්‍රියාත්මක වන්නේද යන්න අධීක්ෂණය කිරීම සඳහා අධීක්ෂණ ආකෘති හඳුන්වා දී ඇත. ඒ අනුව, මෙම වැඩසටහන් ආකාර දෙකෙහිම අනුක්‍රමික ක්‍රියාකාරකම් කාලානුරූපව සිදු කිරීම සහතික කෙරේ.

3.6 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ඩිජිටල් රාජ්‍ය මානව සම්පත් ධාරිතා සංවර්ධන සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මානව ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) ගිවිසුමකට එළඹිණි. මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ ඊ - රාජ්‍ය මූලාරම්භයන්හි ඊලඟ අදියර වෙත යාම සඳහා අත්‍යවශ්‍ය වන තාක්ෂණික තල්ලුව සැපයීම සඳහා රාජ්‍ය අංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ තොරතුරු හා සන්නිවේදන හැකියාවන් වැඩි දියුණු කිරීමයි.

IV වන කොටස

වත්මන් අභියෝග සහ අනාගත සැලැස්ම

4.1 වත්මන් අභියෝග

සියලු මට්ටම්වල කාර්ය මණ්ඩල හිඟය සහ පීඨය තුළ සුදුසුකම් ලත් ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ හිඟය - මෙම ගැටළුව 2017 වසර තුළදී එක්තරා දුරකට විසඳීමට අවධානය යොමු කර තිබෙන අතර පුරප්පාඩු කිහිපයක් පිරවීමට කටයුතු කර ඇත. ඉතිරි පුරප්පාඩු ප්‍රමාණය 2018 වසර තුළදී පිරවීමට අවශ්‍යය. කෙසේවුවද, අනෙකුත් අධ්‍යාපන ආයතන හා සැසඳීමේදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් ලබාදෙන වේතන හා අනෙකුත් ප්‍රතිලාභ ආකර්ශනීය නොවීම හේතුවෙන් එහි අභ්‍යන්තර පීඨය වෙත බඳවාගැනීම සඳහා පළපුරුදු හා ප්‍රසිද්ධ විද්වතුන් ආකර්ශනය කරගැනීම දුෂ්කර වී ඇත. එමෙන්ම, රාජ්‍ය අංශයේ ජ්‍යෙෂ්ඨ හා පළපුරුදු නිලධාරීන් ද්විතීයික පදනමින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට සම්බන්ධ වීමට අකමැති වනුයේ සමාන්තර නිලධාරීන්ට හිමිවන අයිතීන්/ ප්‍රතිලාභ සඳහා අදාළ තනතුරු සුදුසුකම් නොලබන බැවිනි. (භාණ්ඩාගාරයේ අර්ථ දැක්වීම අනුව)

පන්තිකාමර පහසුකම් ප්‍රමාණවත් නොවීම - පුහුණු සඳහා පිරිස් බහුලව පැමිණෙන මාසවලදී පවතින පන්ති කාමර සංඛ්‍යාව තුළින් එම සියලු පුහුණු අවශ්‍යතා සැපිරීම අභියෝගයක් වී ඇත. මෙම ගැටළුව විසඳීම සඳහා යොදාගන්නා උපාය මාර්ගය වශයෙන් පුහුණු සැසි වාර කාල සටහන් නැවත පිළියෙල කිරීම සිදු කෙරේ. තවද, වත්මන් ඉල්ලුමට සරිලන පරිදි පන්තිකාමර පහසුකම් වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවද පැන නැගී ඇත. 2017 වසරේදී ඇතැම් පන්තිකාමරවල තත්වය වැඩි දියුණු කිරීමට කටයුතු කර ඇති අතර 2018 සහ 2019 වසරවලදී ඉතිරි පන්තිකාමරවල තත්වය වැඩි දියුණු කිරීමට සැලසුම් කර ඇත.

4.2 අනාගත සැලැස්ම

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අනාගත සැලැස්ම එහි 2017-2021 උපායමාර්ගික සැලැස්ම තුළින් දැක්වේ. 2017 වසර සඳහා සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් / ඉලක්ක ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් මේ වන විටත් ක්‍රියාවට නංවා ඇත.

ප්‍රධාන අරමුණු 5ක් යටතේ 2017-2021 කාල සීමාව සඳහා යෝජිත උපායමාර්ගික මූලාරම්භයන් පහත දැක්වේ.

අරමුණ 1: ඉගෙනුම් හා සංවර්ධන වැඩසටහන් සම්භාරයක් ප්‍රදානය කිරීම මගින් රාජ්‍ය අංශයේ ධාරිතා සංවර්ධනය කිරීම.

උපායමාර්ගික මූලාරම්භයන්:

- පවතින ආයතන වෙතින් සහභාගී වන පිරිසේ සංඛ්‍යාව ඉහළ දැමීම සඳහා, වැඩිදුර ඉගෙනුම් හා සංවර්ධන වැඩසටහන් සඳහා නැවත සහභාගී වීමට අවශ්‍ය බවට හැඟෙන සේවාලාභී පදනමක් සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ.
    - ලකුණු මත මෙහෙයවන, වෘත්තීය උපකාරක සාමාජිකත්වයක් සහිත අඛණ්ඩ ඉගෙනුම් හා සංවර්ධන වැඩසටහනක් සැලසුම් කිරීම සහ ක්‍රියාවට නැංවීම. සේවා යෝජකයින්ගේ අඛණ්ඩ ඉගෙනුම් හා සංවර්ධන ප්‍රයත්නයන් හඳුනාගනු ලබන එවැනි වැඩසටහනක් සේවා යෝජකයින් අතර ප්‍රචලිත කිරීම.
    - උපාධිධාරීන් සඳහා නිතිපතා අද්‍යතන මාතෘකා යටතේ සාකච්ඡා පැවැත්වීම.
    - රාජ්‍ය සේවය සඳහා අවශ්‍ය වන නිපුණතා සැපිරීම සඳහා පුහුණු අවශ්‍යතා විශ්ලේෂණය මත පදනම් වූ නව වැඩසටහන් සංවර්ධනය කිරීම.

- නව සේවාලාභී කණ්ඩායම්වල සහභාගීත්වය ලබා ගැනීම.
    - රාජ්‍ය සන්තක ව්‍යවසායන් සඳහා ඉගෙනුම් හා සංවර්ධන වැඩසටහන් ආරම්භ කිරීම.
    - පුහුණු හා සංවර්ධන ජංගම සේවාවන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

- නව වැඩසටහන් සඳහා පිරිස් සහභාගීකරවා ගැනීම.
    - ඉල්ලුම මත පදනම් වූ පුහුණු වැඩසටහන් සංවර්ධනය කිරීම.
    - නව පශ්චාත් උපාධි, උසස් ජාතික හා ඩිප්ලෝමා පාඨමාලා වැඩසටහන් සංවර්ධනය කිරීම.
    - මාර්ගගත අද්‍යතන ඉගෙනුම් හා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම.

අරමුණ 2: යම් අරමුණක් පාදක කොට සිදු කරන ලද, රාජ්‍ය ප්‍රතිපත්තිය සහ රාජ්‍ය පරිපාලනය හා සම්බන්ධ පර්යේෂණ අධ්‍යයනයන් සඳහා සුරක්ෂිතාගාරයක් සංවර්ධනය කිරීම.

උපායමාර්ගික මූලාරම්භයන්:

- පහත දැ සිදු කිරීම මගින් පර්යේෂණ පරිසරය වැඩි දියුණු කිරීම
    - ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය තුළ අංග සම්පූර්ණ පර්යේෂණ මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම.
    - පර්යේෂකයින්ගේ සංචිතයක් පිහිටුවීම.
    - ජාතික දෘෂ්ටිකෝණයකින් ඵලදායී වන පර්යේෂණ විෂයය ක්ෂේත්‍ර හඳුනාගැනීම.
    - පර්යේෂණයන්හි නිරත වන අනෙකුත් විශ්වවිද්‍යාල සහ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම.
    - අරමුදල් සපයන නියෝජිතායතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම.
    - පර්යේෂණ තුළින් සොයාගත් කරුණු අදාළ ප්‍රතිපත්ති සම්පාදක ආයතන වෙත ව්‍යාප්ත කිරීම.

අරමුණ 3: රාජ්‍ය අංශයේ ආයතන සහ රාජ්‍ය සන්තක ව්‍යවසායන් වෙතින් සැපයෙන සේවාවන්හි ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා සංවිධානීය සංවර්ධන සේවාවන් ක්‍රියාත්මක කිරීම.

උපායමාර්ගික මූලාරම්භයන්:

- සියලුම රාජ්‍ය ආයතන සහ රාජ්‍ය සන්තක ව්‍යවසායන්හි තීරණ ගන්නන් සමඟ සංවාදයක් ආරම්භ කිරීම සහ ආයතනික සංවර්ධන අවශ්‍යතා තක්සේරු කිරීම.
- හඳුනාගනු ලැබූ පුහුණු අවශ්‍යතා මත පදනම්ව සුදුසු පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම සහ ඒවා ක්‍රියාවට නැංවීම.

අරමුණ 4: ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙතින් සැපයෙන සේවාවන් සඳහා ඉහළ ඉල්ලුමක් ඇති කෙරෙන පරිදි පාර්ශවකරුවන් තුළ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පිළිබඳ ධනාත්මක ප්‍රතිරූපයක් ගොඩ නැංවීම.

උපායමාර්ගික මූලාරම්භයන්:

- ක්‍රමානුකූල හා අඛණ්ඩ පදනමකින් මහජන සම්බන්ධතා ප්‍රකාශන ප්‍රසිද්ධියට පත් කිරීම.
- වෙබ් අඩවිය නිරන්තරයෙන් යාවත්කාලීන කිරීම.

- සමාජ මාධ්‍ය භාවිතය
- කළමනාකරණ තොරතුරු පද්ධතිය /තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය තුළින් සේවා ලාභීන් සමග ඔවුන්ට පහසු අයුරින් සම්බන්ධ වීම.

අරමුණ 5: අනාගත අවශ්‍යතා සැපිරීම සඳහා ආයතනවල ඵලදායී බව හා කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම.

උපායමාර්ගික මූලාරම්භයන්:

- ඵලදායී තීරණ ගැනීමකට පහසුකම් සලසන, අරමුණු පාදක කොටගත් කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීම.
    - ඉගෙනුම් හා සංවර්ධන කාර්යයේ සංඛ්‍යාංකන ක්‍රියාවලියට ගැළපෙන පරිදි තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් හඳුනාගැනීම සහ ස්ථාපනය කිරීම.
    - වඩාත් කාලානුරූප සහ ඵලදායී තීරණ ගැනීමට කළමනාකාරීත්වයට සහාය වීම සඳහා අරමුණු පාදක කොටගත් කළමනාකරණ තොරතුරු පද්ධතියක් සැලසුම් කිරීම හා ක්‍රියාවට නැංවීම සඳහා කාර්ය සාධන බලකායක් පිහිටුවීම.

- ජ්‍යෙෂ්ඨ රාජ්‍ය සේවකයින් සම්බන්ධ කොට උපදේශන සේවා ඇති කිරීම.
    - රාජ්‍ය අංශ නිලධාරීන් සඳහා උපදේශන හා වෘත්තීය මාර්ගෝපදේශන සේවාවක් ඇති කිරීම.
    - උපදේශන හා වෘත්තීය මාර්ගෝපදේශන සැසි පැවැත්වීම.

- විෂයය ක්ෂේත්‍ර විශාල සම්භාරයක් ආවරණය කිරීම සඳහා දක්ෂ ශාස්ත්‍රීය සහ වෘත්තීය කාර්ය මණ්ඩලයකින් සමන්විත පුළුල් සම්පත් සංචිතයක් ඇතිකිරීම.
    - දක්ෂ අභ්‍යන්තර සම්පත් දායකයින් බඳවාගැනීම
    - තවදුරටත් වර්ධනය කළ යුතු දක්ෂතා සහ දැනුම හා කුසලතා මත පදනම්ව බාහිර සම්පත් දායකයින් හඳුනගැනීම සහ ඔවුන්ගේ සේවය ලබාගැනීම

- ඉගෙනුම් හා සංවර්ධන ක්‍රියාකාරකම්වල වර්ධනයක් ඇති කිරීම සඳහා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.
    - පර්යේෂණ මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම.
    - පුස්තකාලය උසස් තත්ත්වයකට ගෙන ඒම හා නවීකරණය කිරීම.
    - දේශන ශාලා උසස් තත්ත්වයකට ගෙන ඒම.
    - නේවාසිකාගාර පහසුකම් වැඩි දියුණු කිරීම.
    - සුබ සාධන සේවා හා පහසුකම් පුළුල් කිරීම හා විවිධාංගීකරණය කිරීම.
    - නුවර එළියේ පිහිටා තිබෙන පරිශ්‍රය තුල ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන සරසවිය පිහිටුවීම (ප්‍රාදේශීය සංවර්ධන මධ්‍යස්ථානය)

- ඉගෙනුම් හා සංවර්ධන කාර්යයේ සංඛ්‍යාංකන ක්‍රියාවලියට ගැළපෙන පරිදි තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් හඳුනාගැනීම සහ ස්ථාපනය කිරීම
    - ඩිජිටල් අන්තර්ගතයේ ගබඩා ධාරිතාව පුළුල් කිරීම
    - ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ මාර්ගගත (online) සේවාවන් සඳහා දුරස්ථ රක්ෂිතකරන පද්ධතියක් (remote backup system) පිහිටුවීම.
    - ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සේවාලාභීන් සඳහා මාර්ගගත ගෙවුම් ක්‍රමයක් සංවර්ධනය කිරීම.
    - එක් වරකට සහභාගිවන්නන් 60 දෙනෙක් සඳහා ඉඩ පහසුකම් සැලසෙන පරිදි තොරතුරු තාක්ෂණ පුහුණු ශාලාවන් පුළුල් කිරීම.
    - නව පුහුණු උපකරණ සහ මෙවලම් සහිතව පුහුණු ශාලා නවීකරණය කිරීම.
    - පුහුණු සඳහා අවශ්‍ය, බලපත්‍ර සහිත මෘදුකාංගවල නවතම අනුවාද ස්ථාපනය කිරීම.
    - පවතින තත් ප්‍රදේශ ජාලය (LAN) සහ පුළුල් ප්‍රදේශ ජාලය (WAN) ප්‍රති වින්‍යාස කිරීම සහ පුළුල් කිරීම.
    - තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම

- තාක්ෂණය හා දැනුම හුවමාරුව සහ සහයෝගී පර්යේෂණ සඳහා දේශීය/ විදේශීය ආයතන සමඟ අඛණ්ඩව සන්ධානගත වීම.
    - තාක්ෂණය හා දැනුම හුවමාරුව සහ සහයෝගී පර්යේෂණ සඳහා විදේශීය ආයතන සමඟ අඛණ්ඩව සන්ධානගත වීම.
    - වත්මන් සහ අනාගත මානව සම්පත් සංවර්ධන හා ආයතනික සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීමේ අරමුණින් දේශීය පාර්ශවකරුවන් සමග සංවාද ආරම්භ කිරීම.
    - තාක්ෂණය හා දැනුම හුවමාරුව සහ පර්යේෂණ සඳහා විදේශීය නියෝජිතායතන සමඟ සහයෝගීතාව ඇති කරගැනීම.

V වන කොටස

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය
2017 දෙසැම්බර් 31 වන දිනට

	සටහන්	2017 රු.ශත	2016 රු.ශත
වත්කම්			
ජංගම වත්කම්			
බැංකු ශේෂ	03	4,051,951.91	60,174,245.55
තැන්පත් නොකළ ලැබීම්		120,376.50	-
තෙමස් තැන්පතු	04	268,046,188.01	248,069,033.43
ලැබීම්	05	36,800,695.54	46,177,612.55
අතැති තොගය	06	3,097,579.47	3,382,999.45
පූර්ව ගෙවීම්	07	4,931,816.97	2,962,861.70
අත්තිකාරම්	08	5,715,120.34	1,138,741.99
කාර්ය මණ්ඩල ණය	09	15,036,793.34	14,291,849.81
		337,800,522.08	**376,197,344.48**
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	10	412,427,321.74	403,822,196.37
පාරිතෝෂික අරමුදල් ආයෝජනය	11	31,591,567.42	28,522,408.40
තැන්පතු ගිණුම	12	1,299,500.00	1,299,500.00
		445,318,389.16	433,644,104.77
මුළු වත්කම්		**783,118,911.24**	**809,841,449.25**
බැරකම්			
ජංගම බැරකම්			
ගෙවිය හැකි තැන්පතු	13	23,151,896.28	50,620,174.65
කල්තබා ලැබීම්	14	79,421,201.83	138,510,095.33
උපචිත වියදම්	15	19,985,653.00	7,828,233.88
අවිනිශ්චිත ලැබීම් සඳහා ප්‍රතිපාදනය		3,221,450.00	1,745,050.00
		125,780,201.11	198,703,553.86
ජංගම නොවන බැරකම්			
දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය	16	24,825,882.55	26,480,941.38
පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදනය	17	28,994,006.20	29,107,585.00
		53,819,888.75	55,588,526.38
මුළු බැරකම්		179,600,089.86	254,292,080.24
ශුද්ධ වත්කම්		**603,518,821.38**	**555,549,369.01**
ශුද්ධ වත්කම්/සම කොටස්			
විලම්බිත ආදායම - භාණ්ඩාගාර ප්‍රදානය		514,054,873.20	478,753,816.81
අනෙකුත් සංචිත - වත්කම් ප්‍රත්‍යාගණන සංචිත	18	12,015,807.00	12,015,807.00
සමුච්චිත අතිරික්තය / හිඟය	19	77,448,141.18	64,779,745.20
මුළු ශුද්ධ වත්කම් /සම කොටස්		**603,518,821.38**	**555,549,369.01**

මූල්‍ය සමාලෝචන

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය
2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා

	සටහන්	2017	2016
		රු. ශත	රු. ශත
ආදායම			
භාණ්ඩාගාරයේ දායකත්වය	20	134,878,943.61	158,292,480.58
අනෙකුත් ආදායම			
පාඨමාලා ගාස්තු	21	4,802,662.00	5,312,052.20
ශාලා කුලියට දීම		6,370,175.00	4,342,900.00
ප්‍රකාශන අලෙවිය		618,280.00	1,417,174.00
ආයෝජන මත ආදායම	22	31,944,464.48	23,820,433.69
ණය පොලී		626,400.73	557,637.75
කුලී	23	8,522,121.13	11,773,851.51
බදු කුලී		1,655,058.33	1,655,058.83
පරිත්‍යාග (එ.ජා.සං.වැ.(UNDP))		3,871,700.36	-
පශ්චාද් උපාධි අධ්‍යයන පාසල		20,679,500.02	24,217,500.00
භාෂා වැඩසටහන		7,104,450.00	12,493,451.36
උපදේශක සේවා	24	137,482,019.51	113,014,845.55
විවිධ ආදායම්	25	4,142,770.91	7,590,191.33
මුළු ආදායම		**362,698,546.08**	**364,487,576.80**
වියදම්			
පුද්ගලික වේතන	26	87,053,813.18	90,032,742.51
කාර්ය මණ්ඩල සුබ සාධනය	27	4,794,399.71	3,276,757.46
ප්‍රවාහන උපවේශන සහ දීමනා	28	9,260,683.06	1,706,344.54
උපයෝගීතාව සහ අනෙකුත් සේවා	29	35,393,023.40	33,621,629.73
ප්‍රවාහනය	30	4,847,841.41	5,399,301.19
ස්ථාවර වත්කම් අලුත්වැඩියාව සහ නඩත්තුව	31	7,517,313.15	11,116,306.76
සැපයුම් සහ අවශ්‍යතා	32	10,910,556.37	8,680,881.14
මූල්‍යමය ගාස්තු	33	4,383,941.00	3,795,310.06
පුස්තකාල සේවා	34	364,945.00	395,959.03
පුහුණු හා ඇගයුම	35	7,743,538.45	15,398,472.29
ප්‍රකාශන සහ තොරතුරු සේවා	36	208,054.00	485,364.90
විදේශ පුහුණු සහ අධ්‍යයන චාරිකා		46,413,155.28	-
ක්ෂය වීම්	37	37,148,051.70	36,174,757.79
පශ්චාද් උපාධි අධ්‍යයන පාසල	38	5,630,763.15	10,133,163.48
ඉංග්‍රීසි භාෂා වැඩසටහන	39	2,859,500.00	3,112,662.64
උපදේශක සේවා	40	65,751,394.79	64,311,155.35
පාඩු හා කපා හැරීම් - TOT		11,736,078.22	-
පාරිතෝෂික ප්‍රතිපාදනය		2,513,632.70	915,984.75
අවිනිශ්චිත ලැබීම් සඳහා ප්‍රතිපාදනය		1,476,400.00	1,150,100.00
ප්‍රකාශන වියදම්		650,808.00	705,461.00
මුළු වියදම්		346,657,892.57	290,412,354.62
කාල සීමාව සඳහා අතිරික්තය/ (හිඟය)		16,040,653.51	74,075,222.18

IV වන කොටස

විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

6.1. විගණන කමිටුවේ වාර්තාව

අංක PED 55 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධි විධානයන්ට අනුව, විගණන කමිටුව, එම කමිටුවේ සභාපතීත්වය දරන භාණ්ඩාගාර නියෝජිතවරයා ඇතුළුව ස්වාධීන විධායක නොවන පාලක සභා සාමාජිකයින් සිවු දෙනෙකුගෙන් (4) සමන්විත වේ.

2017 වසර සඳහා පාලක සභාව විසින් පත් කරන ලද විගණන කමිටුමේ සාමාජිකයින් පහත පරිදි වේ:

කේ.ඩී.එන්.ආර්. අසෝක මහතා	අධ්‍යක්ෂ ජෙනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව (සභාපති - 2017 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා)
පී.බී.එස්.සී. නෝනිස් මහතා	පාලක ජෙනරාල් / කමිටුවේ සභාපති (සභාපති - 2017 සැප්තැම්බර් සිට) පාලක ජෙනරාල් කාර්යාලය, මුදල් අමාත්‍යාංශය
කමල් පත්මසිරි මහතා	ලේකම්, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
කේ.ඩී.ඩී.කේ ද ආබෘ මහතා	පාලක සභා සාමාජික
ඩී.ඒ.වී. මහේන්ද්‍ර රත්නසේකර මහතා	පාලක සභා සාමාජික

6.2. රැස්වීම්

2017 දෙසැම්බර් 31 වනදායින් අවසන් වූ වර්ෂය සඳහා කමිටුවේ ලේකම් වශයෙන් අභ්‍යන්තර විගණක කටයුතු කළේය. එම වසර තුළ විගණන කමිටු රැස්වීම් 4ක් පැවැත්වුණු අතර විගණන කමිටු රැස්වීම් වාර්තා සභාව වෙත නිතිපතා යොමු කරන ලදී. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු වන විගණන අධිකාරී එම්.ආර්.ආර්.කේ. මල්ලව මෙය නිරීක්ෂකයෙකු වශයෙන් සහභාගී විය. එයට අමතරව, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකද ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමට නිරීක්ෂයෙකු වශයෙන් සහභාගී විය. විශේෂ කාරණාවලදී විගණන කමිටුව වෙත උපදෙස් ලබාදීම සඳහා අධ්‍යක්ෂ ජෙනරාල්වරයා සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය එම නිලධාරීන්ට ආරාධනා කර තිබුණි.

2017 මූල්‍ය වර්ෂය තුළ අවස්ථා හතරකදී විගණන කමිටුව රැස් වුණ අතර ඔවුන්ගේ පැමිණීම පහත පරිදි වේ.

නම	2017			
	මාර්තු 24	ජූලි 21	අගෝස්තු 22	නොවැම්බර් 16
රංජිත් අශෝක මහතා (හිටපු සභාපති)	√	√	√	
පී.බී.එස්.සී. නෝනිස් මහතා (වත්මන් සභාපති)				√
කමල් පත්මසිරි මහතා	-	√	√	-
කේ.ඩී.ඩී.කේ. ද ආබෘ මහතා	√	√	√	√
ඩී.ඒ. විජිත් මහේන්ද්‍ර රත්නසේකර මහතා	√	√	√	√

6.3 මෙහෙවර සහ කාර්යයභාරය

කමිටුවේ යොමු කිරීමේ අනුදේශ, අංක PED 55 හා 2010.12.14 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව නිර්වචනය කෙරේ. මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන, අභ්‍යන්තර හා බාහිර විගණන යනාදිය පිළිබඳ පාලක සභාවේ පොදු දැක්මෙහි අරමුණු ඉටු කිරීමට කමිටුව සහාය වේ.

6.4 යොමු කිරීමේ අනුදේශ

අංක PED 55 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව පාලක සභා සාමාජිකයින් විසින් ඉදිරිපත් කර ඇති නියත යොමු කිරීමේ අනුදේශ මඟින් කමිටුව පාලනය වේ. සමුද්දේශ විෂයය සහ රජයේ අවශ්‍යතාවලට අනුකූලව තම වගකීම් ඉටු කිරීමේදී පහත අරමුණු කෙරෙහි කමිටුව අවධානය යොමු කරයි.

- අභ්‍යන්තර විගණන ඒකකයේ වගකීම් නිර්ණය කිරීම සහ වාර්ෂික විගණන සැලසුම් සමාලෝචනය.
- අස්තිත්වයේ සියලු ක්‍රියාකාරකම් සඳහා අභ්‍යන්තර පාලන පද්ධතීන් සමාලෝචනය සහ ඇගයුම.
- පිරිවැය ඵලදායිතාව සඳහා සහ නාස්තිකාර වියදම් ඉවත් කිරීම යනාදිය සඳහා නියත කාල අන්තරවලදී කාර්යසාධනය සමාලෝචනය කිරීම.
- බාහිර විගණකයින් සමග සම්බන්ධීකරණය ඇති කරගැනීම සහ විගණකාධිපතිගේ /බාහිර විගණකයින්ගේ කළමනාකරණ ලිපි සම්බන්ධයෙන් පසු විපරම සිදු කිරීම.
- ව්‍යවස්ථා, රෙගුලාසි, නීති සහ චක්‍රලේඛ අනුකූල වන බව නිශ්චය කිරීම.
- ගිණුම්කරණ ප්‍රමිති හා අනුගත වන්නේද යන්න සහතික කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම.
- අභ්‍යන්තර විගණන/ බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපි සමාලෝචනය කොට ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගැනීම.
- පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/නියෝග ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම.
- කමිටුව විසින් සැලකිල්ලට ගත යුතු, ක්‍රියාවට නැංවිය යුතු හෝ වැඩි දියුණු කළ යුතු දෑ වශයෙන් හඳුනා ගනු ලැබූ ඕනෑම කාරණයක් පාලක සභාව වෙත වාර්තා කිරීම.
- වාර්ෂික වාර්තාවේ ඇතුළත් කිරීම සඳහා කමිටුවේ සොයාගැනීම් පිළිබඳ වාර්තාව පිළියෙල කිරීම.

6.5 මූල්‍ය වාර්තාකරණය

පාර්ශ්වකරුවන් වෙත සැපයෙන තොරතුරුවල විශ්වසනීයත්වය සහතික කිරීම සඳහා මූල්‍ය වාර්තාකරණ පද්ධතියේ ඵලදායී බව කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි. ගිණුම් පොත් හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා පාලක සභාව සතු වන වගකීම ඉටු කිරීමට කමිටුව පාලක සභාවට සහාය වෙයි. සියලු ගනුදෙනු නිවැරදිව හා සම්පූර්ණයෙන් ගිණුම් පොත්වල වාර්තා වන බවට සාධාරණ සහතිකයක් සැපයීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සහ ක්‍රියා පටිපාටීන්වල ප්‍රමාණවත් බව සහ ඵලදායී බව කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි.

කමිටුව විසින් සියලුම ත්‍රෛමාසික විගණනය නොකළ අතුරු මූල්‍ය ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශන සමඟ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සිදු කරන ලද වැදගත් උපකල්පන හා විනිශ්චයන් ඇතුළත් වූ උපකාරක තොරතුරු සමාලෝචනය කරන ලදී.

6.6 අභ්‍යන්තර පාලන

විගණන කමිටුව විසින් 2017 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය වාර්තාකරණයේදී අභ්‍යන්තර පාලනයේ ඇති ඵලදායී බව තක්සේරු කරන ලදී. මෙම ක්‍රියාවලිය මඟින් අභ්‍යන්තර පාලන කටයුතුවල සහ නීති හා රෙගුලාසි සමග අනුගත වීම සහතික කිරීම සඳහා පවතින අවදානම් පාලනය කිරීමේ ක්‍රියාවලිවල ප්‍රමාණවත් බව සහ ඵලදායී බව තක්සේරු කරනු ලබයි. අභ්‍යන්තර විගණකයින් විසින් ලබාදෙන නිර්දේශ මත පදනම්ව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතියෙහි ඵලදායී බව වැඩි දියුණු කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් සුදුසු ක්‍රියාමාර්ග ගනු ලබන බව කමිටුව සහතික කරයි. අභ්‍යන්තර පාලන රාමුවේ පදනම මගින් පාලක සභාව වෙත එහි කාර්යයන් අඛණ්ඩව සිදු කිරීම සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා හැකියාව ලබාදේ.

6.7 අභ්‍යන්තර විගණනය

විගණනය කරනු ලබන ක්‍රියාකාරකම්වල අභ්‍යන්තර විගණන කටයුතු ස්වාධීනව සිදු කෙරෙන බවත් අපක්ෂපාතීව හා නිසි ව්‍යක්තීමය අයුරින් සිදු කෙරෙන බවත්, විගණන කමිටුව සහතික කරයි. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අභ්‍යන්තර පාලන අංශයේ ක්‍රියාකාරකම්වල විෂය පථය, සම්පත්, වපසරිය සහ ඵලදායී බව විගණන කමිටුව විසින් අධීක්ෂණය හා සමාලෝචනය කරන ලදී.

පී.බී.එස්.සී. නෝනිස්
සභාපති
විගණන හා කළමනාකරණ කමිටුව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ඊඑවිඒ/සී/එස්එල්අයිඩීඒ/එෆ්එස්/01/2017/15

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2018 ඔක්තෝබර් 16 දින

29 OCT 2018

අධ්‍යක්ෂ ජනරාල්,

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

ADA (Acl/F) for Acl
9/10/18

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

පිටපත් :- 1. ලේකම්, රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය
2. ලේකම්, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.auditorgeneral.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඊඑවිඒ/සී/එස්එල්අයිඩීඒ/එෆ්එස්/01/2017/15

මඹේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 ඔක්තෝබර් 16 දින

අධ්‍යක්ෂ ජනරාල්,

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1982 අංක 09 දරන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන පනතේ 21 වන වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත 2018 ජූලි 31 දින නිකුත් කරන ලදි.

1.2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රමිතයෙහි 48 ඡේදය අනුව, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ආදායම් සහ වියදම්, එකිනෙක හිලව් නොකළ යුතු වුවත් වෙනත් ලැබිය යුතු ශේෂයෙන්, රු.113,645 ක් වූ ගෙවිය යුතු ශේෂය හිලව් කර දක්වා තිබුණි.

(ii) විවක්ෂණ සංකල්පය හා ගැළපුම් සංකල්පයට අනුකූල වෙමින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත් ඊට පටහැනි ලෙස UNDP ව්‍යාපෘතියෙන් පරිත්‍යාගයක් ලෙස ලද රු.3,871,700 ක් වූ ගොඩනැගිලි වටිනාකම එහි ප්‍රාග්ධන ස්වරූපය නොසලකා ආදායමක් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

ප්‍රමිතයෙහි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.150,288,622 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

(අ) ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය ගණනය කිරීමේදී රු.174,789 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) පසුගිය වර්ෂයේදී පුනරාවර්තන ප්‍රදාන රු.3,000,000 ක් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම් ගත කර තිබුණු අතර එම වරද නිවැරදි කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී රදවාගත් ලාභ ගිණුම හර කර නැවතත් ප්‍රාග්ධන ප්‍රදාන රු.3,000,000 කින් බැර කර තිබීම හේතුවෙන් ප්‍රාග්ධන ප්‍රදාන රු.6,000,000 ක් වැඩියෙන් හා රදවාගත් ලාභ ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ඉහත ස්ථාවර වත්කම්වලට අදාළ ක්ෂය ගණනය කිරීමේදී වත්කම් වර්ග 03 කට අදාළව රු.2,254,492 ක අධි ගණනය කිරීමක්ද, වත්කම් 4 කට අදාළව රු.534,364 ක ඌන ගණනය කිරීමක්ද දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය වටිනාකම රු.1,720,128 කින් වැඩියෙන් දක්වා තිබුණි.

2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

ස්ථාවර වත්කම් පිරිවැය, ලෙජර ගිණුම් ශේෂය හා උපලේඛනවල ශේෂයන් සමග සැසඳීමේදී අයිතම 04 ක වටිනාකම රු.3,627,594 ක් අඩුවෙන්ද අයිතම 03 ක වටිනාකම රු.11,275,516 ක් වැඩියෙන්ද දක්වා තිබීම හේතුවෙන් වත්කම් ශේෂයන්ගේ රු.7,647,922 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අංශ 03 ක වැඩසටහන් වෙනුවෙන් වෙනත් ලැබිය යුතු ශේෂයෙන් වර්ෂ 03 සහ වර්ෂ 05 අතර කාලයක සිට ලැබිය යුතු ශේෂය රු.9,128,734 ක් වූ අතර, වර්ෂ 05 ක් ඉක්මවූ ශේෂය රු.388,141 ක් විය.

(ආ) උපදේශන හා දෙමළ වැඩසටහන් පැවැත්වීම සඳහා ලැබුණු ගාස්තුවලින් වර්ෂ 3 ක් සහ වර්ෂ 5 ක් අතර කාලය තුළ දී ආපසු ගෙවිය යුතුව තිබුණු ශේෂය රු.4,078,317 ක් වූ අතර, වර්ෂ 05 ක් ඉක්මවූ ශේෂය රු.3,121,970 ක් විය.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත පරිදි නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම
(අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 114 වගන්තිය	උපයන විට ගෙවීම් බදු, අදාළ මාසයට පසුව එළඹෙන මාසයේ 15 දිනට ප්‍රථම දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු වුවත් 2017 වර්ෂයේ මාස 08 කට අදාළව අයකරගනු ලැබූ රු.598,734 ක් වූ උපයන විට ගෙවීම් බදු ප්‍රේෂණය කර තිබුණේ 2018 වර්ෂයේ මුල් මාස 2 තුළදීය.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 571	වර්ෂ දෙක ඉක්මවූ රඳවාගත් තැන්පතු රු.2,283,525 ක් වූ ශේෂය සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ඇ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	2017 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව නියමිත කාල රාමුව තුළ විගණකාධිපතිවරයා වෙත හා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් විගණිත දිනය වූ 2018 සැප්තැම්බර් 04 දින දක්වාම ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ)	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	වටිනාකම රු.45,771,495 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.
(ඉ)	2015 මැයි 15 දිනැති අංක 1/2015/01 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ අංක 6(අ)(2) වගන්තිය	එක් දින සේවාව මගින් විදේශ ගමන් බලපත්‍ර ලබා ගැනීමේ දී සාමාන්‍ය බලපත්‍ර ගාස්තුව පමණක් ප්‍රතිපූර්ණය කළ හැකි නමුත්, මෙම විධිවිධානයට අනුකූල නොවී එක් දින සේවාවේ සම්පූර්ණ ගාස්තුව වන රු.10,000 ක් ප්‍රතිපූරණය කර තිබුණි.
(ඊ)	2007 උපදේශකයින් තෝරා ගැනීම හා සේවයේ යෙදවීමේ මාර්ගෝපදේශ සංග්‍රහය 4.4 මාර්ගෝපදේශය	ඉංජිනේරු උපදේශකයින් තෝරා පත්කර ගැනීමේ දී අමාත්‍යාංශය තුළ ඉංජිනේරු අංශයක් හා ඉංජිනේරුවරයින් සිටියදී ඔවුන්ගේ සේවය ලබා ගැනීමකින් තොරව ආපනශාලා නව ගොඩනැගිල්ල සඳහා ඇස්තමේන්තු සකස් කිරීමට හා අනෙකුත් සේවාවන් සඳහා වෙනත් රජයේ ආයතනයකින් සේවාවන් ලබා ගෙන ඉංජිනේරු උපදේශක ගාස්තුව ලෙස රු.110,098 ක් ගෙවා තිබුණි.
(උ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006	
	(i) 3.4(උ) මාර්ගෝපදේශය	වැඩ සඳහා වෙළඳපල මිල සැදහුම් ක්‍රමය යොදා ගැනීමේ දී ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් පමණක් මිල ගණන් ලබා ගත යුතු වුවත් රු.7,413,773 ක් වටිනා ආපනශාලා නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මිල ගණන් කැඳවන ලද ආයතන 05 න් CIDA ලියාපදිංචිය ලබා ගෙන තිබුණේ එක් ආයතනයක් පමණි. තවද ලැබී තිබූ ලංසු 05 න් ලංසු 04 ක් පමණක් මුද්‍ර තැබූ ඒවා වීමෙන් මාර්ගෝපදේශයෙන් බැහැර වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ii) 2.14.1 මාර්ගෝපදේශය	මුද්‍රා තැබූ මිල ගණන් කැඳවීමෙන් තොරව රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාවෙන් වර්ණ ඡායා පිටපත් යන්ත්‍රයක් හා ලේසර් මුද්‍රණ යන්ත්‍රයක් පිළිවෙලින් රු.529,000 කට හා රු.50,000 කට මිලදී ගෙන තිබුණි. තවද නේවාසිකාගාරය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.891,018 ක් වටිනා ගොඩනැඟිලි ද්‍රව්‍ය සෘජුවම සංස්ථාවෙන් මිලදී ගෙන තිබුණි.
(iii) 5.3.3 මාර්ගෝපදේශය	ලංසු ආරාධනා සඳහා ඇතුළත් විය යුතු පොදු උපදෙස් යටතේ ලංසු විවෘත කිරීමේ පටිපාටිය පිළිබඳ තොරතුරු ඇතුළත් කළ යුතු වුවද ආපනශාලා නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ ලංසු කැඳවීමේ ආරාධනය තුළ එම තොරතුරු ඇතුළත් කර නොතිබීම හේතුවෙන් කිසිදු ලංසුකරුවෙකු ලංසු විවෘත කිරීමේ අවස්ථාව සඳහා සහභාගි වී නොතිබුණි.

2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2013 වසරේ සිට උපදේශන වැඩසටහන් පැවැත්වීම සඳහා ලැබී ඉතිරි වූ, නමුත් ආපසු ගෙවිය යුතු මුදලෙන් රු.290,700 ක් ආපසු ඉල්ලුම් නොකරන බව නිශ්චිතව තහවුරු කර ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ දී ආදායම් ලෙස හඳුනා ගෙන තිබුණි.

(ආ) "ආයතනයේ ආයතනික ධාරිතාව ඉහළ නැංවීම" යන මැයෙන් 2013 පෙබරවාරි 14 දිනැතිව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2013 අප්‍රේල් 19 දිනැති අංක අමප/13/0237/523/011 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් "ද්විතීයනය කරන ලද අධ්‍යයන කාර්ය මණ්ඩලයට පමණක් සීමා වන පරිදි ද්විතීයන දීමනාව මූලික වැටුපෙන් සියයට 50 ක් දක්වා ඉහළ නැංවීම" සඳහා අනුමැතිය ලැබී තිබුණි. නමුත් ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් "ආයතනයේ ද්විතීයන පදනම මත සේවයේ නියුතු

සියලුම මාණ්ඩලික නිලධාරීන් අධ්‍යයන රාජකාරි ඉටු කරනු ලබන බවට" පවසමින් අමාත්‍යාංශ ලේකම්වරයාට කරන ලද ඉල්ලීමට ලැබුණු අනුමැතිය හා පාලක මණ්ඩලයේ අනුමැතිය මත පමණක් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ද්විතීයන පදනම මත සේවයේ නියුක්තව සිටින සියළුම අනධ්‍යයන මාණ්ඩලික නිලධාරීන්ට ගෙවිය යුතු සියයට 25 ක් වූ දීමනාව සියයට 50 ක් ලෙස ගෙවීම හේතුවෙන් 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා රු.2,688,162 ක දීමනා වැඩියෙන් ගෙවා තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.16,040,654 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.74,075,222 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.58,034,568 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී විදේශ පුහුණු වැඩසටහන් සඳහා වැය කළ මුදල රු.46,413,155 කින් වැඩි වීම හා රු.11,736,078 ක ලැබිය යුතු ශේෂ කපා හැර තිබීම මූල්‍ය ප්‍රතිඵලයෙහි අඩු වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී, 2013 වර්ෂයේදී රු.32,251,344 ක් වූ ඌනතාවය 2014 වර්ෂයේදී රු.34,195,260 ක් දක්වා වර්ධනය වී තිබුණි. එසේ වුවද 2016 වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලය රු.74,075,222 ක අතිරික්තයක් බවට පරිවර්තනය වුවද, 2017 වර්ෂයේදී එම අතිරික්තය නැවතත් රු.16,040,653 ක් දක්වා අඩුවී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසුව 2013 වර්ෂයේදී රු.58,984,596 ක් වූ දායකත්වය 2016 වර්ෂය වන විට රු.205,265,825 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදී රු.154,297,600 ක් දක්වා පහළ යාමක් පෙන්නුම් කෙරුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂයේ ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම අවස්ථා දෙකක දී සංශෝධනය කර තිබුණු අතර, මූලික ක්‍රියාකාරී සැලැස්මෙහි සිදුකරන වෙනස්කම් සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම ආයතනයේ අරමුණු ඉටු කිරීම සඳහා පිළියෙල කරනු ලැබ ඇතත් අපේක්ෂිත සංඛ්‍යාත්මක වටිනාකම් දක්වා නොතිබුණි. තවද ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් අංශ 04 ක් සම්බන්ධයෙන් ප්‍රගතියද වාර්තාකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දී අමාත්‍යාංශයට ඉදිරිපත් කරනු ලැබූ ප්‍රගති වාර්තාවේ ප්‍රාග්ධන වියදම්හි මූල්‍ය ප්‍රගතිය පමණක් ඉදිරිපත් කර තිබුණු නමුත් ආයතනයේ අරමුණුවල භෞතික ප්‍රගතිය පිළිබිඹු වන අයුරින් ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණි.

4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

2008 අප්‍රේල් 24 දිනැති අංක 431 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන පරිදි "විදේශගත වන සියළු රාජ්‍ය නිලධාරීන් ශ්‍රී ලංකන් එයාර් ලයින් සමාගමින් පමණක් ගුවන් ගමන් සේවා ලබා ගත යුතු වේ. සමාගම ගුවන් ගමන් සේවා නොසපයන ගමනාන්ත සඳහා පමණක් අදාල රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය යටතේ වෙනත් ගුවන් සේවා සමාගම් මගින් පහසුව සලසා ගත හැක." නමුත් ගුවන් ගමන් යානා පත්‍ර නියෝජිත ආයතන 03 ක් ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ මිල ගණන් ඉදිරිපත් කර තිබියදී චීනයේ පැවති පුහුණු වැඩසටහන සඳහා නිලධාරීන් 29 දෙනෙකු වෙනුවෙන් රු.2,030,000 ක් හා එක්සත් රාජධානියේ පැවති පුහුණු වැඩසටහන සඳහා නිලධාරීන් 13 දෙනෙකු වෙනුවෙන් රු.2,079,350 ක යානා පත්‍ර විදේශ ගුවන් සමාගම්වලින් මිලදී ගැනීම නිසා ශ්‍රී ලංකන් එයාර් ලයින් සමාගමට ලැබිය යුතුව තිබුණු රු.4,109,350 ක් වෙනත් විදේශීය ගුවන් සමාගම්වලට ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

4.3 දෘශ්‍ය අක්‍රමිකතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දී සංචාරක බංගලාව වෙන් කිරීම සඳහා එකතු වී තිබූ මුදලින් ආයතනයේ බැංකු ගිණුමට බැර කර නොතිබුණු බවට විගණනයට නිරීක්ෂණය වූ වටිනාකම රු.262,100 ක් විය.

(ආ) ආයතනයේ සිසුන් වශයෙන් දීප ව්‍යාප්ත සේවාවල නිලධාරීන් සහ පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහන්වල නිලධාරීන් පුහුණුව සඳහා විදේශගත වන අවස්ථාවලදී, ආයතනයෙන් සහභාගීවන සම්බන්ධීකරණ නිලධාරීන් පුහුණු කණ්ඩායම සමග නිරන්තරයෙන් සිටිය යුතු වන අතර පුහුණු කණ්ඩායම සමග නවාතැන් හා අනෙකුත් පහසුකම් ලබා නොගෙන ඉන් බැහැර නවාතැන් ගෙන ඇති බවක්ද විගණනයට නිරීක්ෂණය නොවුණි. එසේ වුවද ඔවුන් පුහුණු කණ්ඩායමේ නිලධාරීන් වශයෙන් සැලකිල්ලට ගෙන එම වියදම ද පුහුණු කණ්ඩායමේ වියදම් ලෙස ආවරණය කර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2015 මැයි 15 දිනැති මුදල් අමාත්‍යාංශ 01/2015/01/ චක්‍රලේඛයේ 04 (අ) ඡේදයේ විධිවිධානවලින් බැහැරව ආයතනයේ නිලධාරීන් 18 දෙනෙකු සඳහා සංයුක්ත දීමනාව දළ වශයෙන් රු.7,006,850 ක් අනිකුත් නිලධාරීන්ට වඩා වැඩියෙන් ගෙවා තිබුණි.

4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනුමත කාර්ය මණ්ඩලය 165 ක් වුවද, ඉන් තනතුරු 56 ක් පුරප්පාඩුව පැවතුණි. කාර්ය මණ්ඩලය ස්ථාපිත කර ඇත්තේ ආයතනයෙහි අරමුණු ඉටු කිරීමට අදාළ නිශ්චිත කාර්යයන් සඳහා වන බැවින් අනුමත මාණ්ඩලික තනතුරු 46 න් 25 ක්ද මාණ්ඩලික නොවන තනතුරු 24 න් 13 ක්ද වශයෙන් අනුමත තනතුරු සංඛ්‍යාවෙන් සියයට 50 කට වැඩි ප්‍රමාණයක් පුරප්පාඩුව පැවතීම ආයතනයේ අරමුණු ඉටු කරවා ගැනීම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) තථ්‍ය කාර්ය මණ්ඩලය තුළ ද්විතියනය පදනමට බඳවාගත් මාණ්ඩලික නිලධාරීන් සංඛ්‍යාව 11 ක් වූ අතර මාණ්ඩලික නොවන හා අනෙකුත් කාර්ය මණ්ඩලය 08 ක් විය.

5. තිරසාර සංවර්ධනය

5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 " න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් දැනුවත් වී තිබුණි.

මේ සම්බන්ධයෙන් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව දැනුවත් වී තිබුණද ඒ කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු සඳහා ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟා වීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව දැනුවත් වීම මත ආයතනය විසින් සිය විෂය පථයට අනුව ළඟා කර ගත යුතු අරමුණු 04 ක් හඳුනාගෙන තිබුණි. එසේ වුවද සියල්ලන් සඳහාම දැරිය හැකි තිරසාර සහ නවීන බලශක්ති සැපැයුම සහතික කිරීම සඳහා ප්‍රගතිය මැන බැලීමේ දර්ශකය ලෙස විදුලි බිල සියයට 30 කින් අඩුකිරීම හැරුණු විට අනෙකුත් අරමුණු වෙනුවෙන් ඉලක්ක, දර්ශක හා සන්ධිස්ථානයන් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යාවශ්‍ය වුවත්, ආයතනය විසින් තිරසාර සංවර්ධන ඉලක්කයන්හි ළඟා වීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) තිරසාර ඉලක්ක කරා ළඟා වීම සඳහා ආයතනය විසින් හඳුනා ගත් කාර්යයන් ආයතනයේ සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබූ අතර එම කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂික අයවැයට ඇතුළත් කර නොතිබුණි.

(ඉ) තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට සූදානම් වීමේදී සියල්ලන් සඳහා දැරිය හැකි විශ්වසනීය තිරසාර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරීම හැර අනෙකුත් අරමුණු ළඟාකර ගැනීමට අනෙකුත් ආයතන සමග මනා සම්බන්ධීකරණයක් නොකිරීම හේතුවෙන් ඉලක්කගත අරමුණු කරා ළඟා වීමට සැලැසුම් සකස් කිරීමේ හා පෙර සූදානම් වීමේ ක්‍රියාවලිය ඉතා මන්දගාමී තත්ත්වයක පැවති බව නිරීක්ෂණය විය.

6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

6.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රගතිය පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණ විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව ආපන ශාලා දෙවන අදියර, නිල නිවාස ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම සහ වාහන අළුත්වැඩියා කිරීම භෞතික ප්‍රගති පිළිවෙලින් සියයට 25 ක්, සියයට 35 ක් සහ සියයට 85 බැගින් වුවද ඒවායේ මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 45, සියයට 51 සහ සියයට 65 ක් වී තිබුණි.

(ආ) ආයතනය විසින් ටෙන්ඩර් වාර්තා ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

6.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

2016/2017 වර්ෂය සඳහා ආයතනයේ ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා 2016 වර්ෂයේ දී සැපයුම්කරුවෙකු තෝරා ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ අනුව ලංසුපත් මිලදී ගත් ආයතනයක් කොන්දේසි සහිත ලංසුවක් ඉදිරිපත් කර තිබුණු බවට දක්වා තිබුණද, එම ආයතනය නිසි පරිදි විස්තර සපයා තිබුණු බවට විගණනයට නිරීක්ෂණය විය.

(ii) ආයතනික කාර්යමණ්ඩලය නිලධාරීන් 109 දෙනෙකුගෙන් යුක්ත වූ අතර ඉන් නිලධාරීන් 20-30 ක ප්‍රමාණයක් පමණක් ආපනශාලාව තුළින් ආහාර මිල දී ගන්නා අතර බහුතර පාරිභෝගිකයන් වන්නේ ආයතනයේ පුහුණු හා පාඨමාලා හදාරන්නන් වේ. ප්‍රසම්පාදනය ඇගයීමේ දී ආයතනයේ නිලධාරීන් සහ බාහිර නිලධාරීන් යන කාණ්ඩ දෙකටම ඉදිරිපත් කරන ලද ආහාර මිල ගණන් පිළිබඳව ඇගයිය යුතු වුවත් ආපන ශාලාව පැවැත්වීමේ ප්‍රධාන අරමුණ සුභසාධනය ඉටුකිරීම වශයෙන් දක්වා කෙටි ආහාර සඳහා අවම මිල ඉදිරිපත් කළ නමුත් උදෑසන සහ දිවා ආහාරය සඳහා වැඩි මිලක් ඉදිරිපත් කරන ලද ආයතනයට ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි.

(iii) සැපයුම්කරු ලෙස තෝරා ගන්නා ලද ආයතනය විසින් ඉදිරිපත් කරන ලද ලංසු ලියවිලි තුළ ලබාදෙන කෙටි ආහාර පිළිබඳ අයිතමය සඳහා ආහාර වර්ග මොනවාද යන්න සඳහන් නොකර පැවතීම සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුවේ අවධානය යොමු කර නොතිබුණි.

(iv) ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය උපකරණ (ගෘහ භාණ්ඩ හැර) ආයතනය විසින් සපයනු ලබන බවට ප්‍රසම්පාදන ලියකියවිලි මගින් ලංසුකරුවන් වෙත සන්නිවේදනය කර නොතිබුණි.

(v) මෙම ප්‍රසම්පාදනයේදී ලංසුකරුගේ මිල පහත දැමීම සඳහා සාකච්ඡා කිරීම සඳහා තාක්ෂණික සහ ප්‍රසම්පාදන කමිටු සාමාජිකයෙකු නොවන නිලධාරියකු වන අධ්‍යක්ෂ (පාලන) බලය පැවරීමකින් තොරව සහභාගී වී තිබුණි.

6.3 අයවැය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.4 ඡේදය අනුව කෙටුම්පත් අයවැය ලේඛනය ගිණුම් වර්ෂය ආරම්භ වීමට මාස 03 කට පෙර පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබුණේ 2016 නොවැම්බර් 30 දිනදීය.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.2 වගන්තිය ප්‍රකාරව ආයතනයේ වාර්ෂික අයවැය ලේඛනය පාලක මණ්ඩලය විසින් කාලීනව සමාලෝචනය කර අවශ්‍ය සංශෝධනයන් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2017 වර්ෂයේ විදේශ ගමන් වියදම් රු.මිලියන 8.5 ක් වුවද පාලක මණ්ඩලය විසින් අනුමත කර තිබුණේ රු.මිලියන 5.5 ක් පමණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් සැසඳීමේදී වියදම් විෂයයන් 07 ක සියයට 08 සිට සියයට 100 දක්වා ඉතිරියක් ද තවත් වියදම් විෂයයක සියයට 108 කින් ඉක්මවා යාමක් ද නිරීක්ෂණය විය. අයවැයගත ආදායම තථ්‍ය ආදායම සමග සැසඳීමේදී විෂයයන් 03 ක සියයට 40 සිට සියයට 70 දක්වා විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

6.4 නොවිසඳී ඇති විගණන ඡේද

ආයතනයේ පවත්වා ගෙන යන බැංකු ගිණුම් දෙකෙහි ශේෂයන් විශ්ලේෂණය කිරීමේදි වර්ෂය පුරාම දිනපතා සාමාන්‍ය වශයෙන් රු.5,000,000 කට ආසන්න ශේෂයක් පවත්වා ගන්නා බවට නිරීක්ෂණය වූ අතර ජංගම ගිණුම්වල විශාල මුදල් ප්‍රමාණයක් රඳවා තබා ගන්නවාට වඩා ඉල්ලූවිට ගෙවන තැන්පතුවල (Call Deposits) මුදල් ආයෝජනය කිරීමෙන් ආදායමක් ලබා ගැනීමට තිබූ අවස්ථාව පිළිබඳව විචක්ෂණශීලි ලෙස සලකා කටයුතු කර නොතිබුණි.

7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලනයන් පිළිබඳ අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුයි.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර		නිරීක්ෂණ
(අ)	ගේට්ටු අවසරපත් නඩත්තු කිරීම	ප්‍රධාන ගේට්ටුව හරහා ධාවනය වන වාහන පිළිබඳව ගේට්ටු පොතේ සටහන් නොකිරීම.
(ආ)	සංචාරක බංගලාව වෙන් කිරීම	බංගලාවේ වෙන්කිරීම් කටයුතු පසු විපරම් කිරීමට කටයුතු නොකිරීම.
(ඇ)	ණයගැතියන් හා ණයහිමියන්	ශේෂ සනාථ ලබාගෙන එම ශේෂ පියවීමට කටයුතු නොකිරීම.
(ඈ)	ප්‍රසම්පාදන ලිපිගොනු නඩත්තු කිරීම	(i) ප්‍රසම්පාදන ලිපි ගොනුවේ ඇතුළත් විය යුතු ලිපි ඇතුළත් නොවීම. උදා; වැඩ බිම භාරදීමේ හෝ ආපසුහාර ගැනීමේ ලිපි ඇතුළත්ව නොතිබුණි.
		(ii) ආපනශාලා ගොඩනැගිල්ල කොන්ත්‍රාත්තුවේ අනුගමනය කරන ලද ප්‍රසම්පාදන ක්‍රමය කුමක්ද යන්න සඳහන් නොකිරීම.

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති